අද
city edition
2023-12-15
සිකුරාදා
012 / 247
RS.40/=

ශානිට ප්‍රමාණවත් ආරක්ෂාවක් දෙන්න

>>P2

අභියාචනාධිකරණයෙන් පොලිස්පතිට නියෝග

සැහැල්ලු දුම්රිය නැවත ගේන්න ජපානය සමග සාකච්ඡා

>>P2



ලොකු ලූනු කිලෝව රු.500 ඉක්මවයි

>>P2



බුවනෙකබා රාජසභා මණ්ඩපය කැඩූ

කුරුණෑගල හිටපු නගරාධිපති සහ 4ක් අවුරුදු 3ක් හිරේට

හිටපු නාගරික කොමසාරිස්, හිටපු නාගරික ඉන්ජිනේරු, හිටපු වැඩ පරීක්ෂක සහ බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුවන් ඒ අතර

සැකකරුවෝ වරද පිළිගනිති

අලාභ හානියට ගෙවන්න කී රු.එක්කෝටි තිස්හත් ලක්ෂ පනස් දහසක වන්දි මුදල හා දඩ මුදල් ඒ මොහොතේම ගෙවයි >>P3

හිටපු හමුදා සෙබළෙකුගේ මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කරලා

වැ.ඛ.පොලිස්පති දේශබන්දු ඇතුළු පොලීසියේ 4කට ලක්ෂ 5ක් බැගින් ගෙවන්න වෙයි

>>P3

වසර 4ක් තුළ 732,000ක් විදේශ රැකියා සඳහා ගිහින්

ජනුර් කිව්ලාත්-කුරුණෑගල

ආර්ථික අර්බුද හේතුවෙන් වසර 4ක් තුළ විදේශ රැකියා සඳහා 732,000ක පිරිසක් විදේශ ගතවී ඇති බව තොරතුරු පනතින් හෙළිවේ. මෙම පිරිස විදේශගතවී ඇත්තේ ගෘහ සේවිකාවන්, සාත්තු සේවිකාවන්, කම්කරු වෘත්තිකයන්, විදුලි කාර්මික ෂිල්පින්, රියදුරු, ඇතුළු වෙනත් වෘත්තීන් සඳහා බව එම තොරතුරුවලින් වැඩිදුරටත් අනාවරණය වේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රදේශීය කාර්යාල 15ක් දිවයින පුරා පැතිරී ඇති අතර, මෙම කාර්යාලවල උපදෙස් ලබාගෙන ඒ අනුව මෙම පිරිස නීත්‍යානුකූලව විදේශ ගතවූ බවද හෙළිවේ. ලෝකයේ පවතින ඉහළ වැටුප් සහිත රැකියා අවස්ථා ලබා ගැනීමට නම් මෙරට ශ්‍රම බලකාය ජාත්‍යන්තර ශ්‍රම වෙළෙඳපළට ගැළපෙන ලෙස වෘත්තීය පුහුණුව හා කුසලතා සවිබල ගැන්වීම අනිවාර්ය වන අතර ඒ සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රදේශීය මධ්‍යස්ථාන 17ක් දිවයින පුරා පිහිටුවා ඇත.

මෙසේ විදේශගතවී ඇති පිරිස 2020 වසරේ 59,000ක් 2021 වසරේ 1,10,000ක් 2022 වසරේ 3,11,000ක් සහ 2023 වසරේ මේ වන විට 2,52,000ක් පමණ වන බවද පනතේ තොරතුරුවලින් හෙළිවේ.

කොළඹ අනාරක්ෂිත ගස් ගැන සමීක්ෂණයක් සිදුකර නෑ

– කොළඹ මහ නගර සභාව කියයි

ඉන්දික හේවාවිතාරණ

කොළඹ මහ නගර සභා සීමාව තුළ තිබෙන කඩා වැටීමට ආසන්න හා අනාරක්ෂිත ලෙස පවතින ගස් පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොමැති බව කොළඹ මහ නගර සභාව සඳහන් කරයි.

එහෙත් මේ වසරේ ගෙවීගිය කාලය තුළදී අනාරක්ෂිත ගස් ලෙස හඳුනාගත් ගස් 38ක් කපා ඉවත් කරගෙන තිබෙන බවත්, එම ගස්වල දැවමය වටිනාකමක් නොමැති බවත් පෙන්වා දෙයි.

නගර සභාවේ උපකරණ උපයෝගි කරගෙන නගර සභා සේවකයන් විසින් අදාළ ගස් ඉවත් කර තිබෙන බවත්, ඉවත් කරන ලද ගස්වල දැව කොටස් මහ නගර සභාව සතුව පවතින බවත් මහ නගර සභාව සඳහන් කරයි.

මේ ආකාරයේ ගස් කපා ඉවත් කිරීමට අදාළව සේවකයන් 13ක් සිටිය යුතු වුවත් දැනට සේවය කරනු ලබන්නේ සේවකයන් 10දෙනෙකු පමණක් බවත්, මේ අනුව පුරප්පාඩු තුනක් පවතින බවත් පෙන්වා දෙයි.

රු.කෝටි 107ක් වටිනා හෙරොයින් විනාශ කරයි

>>P6

සීසර්ලාගේ අනීතික වාහන අත්පත් කර ගැනීමට එරෙහිව හිටපු පොලිස්පති චක්‍රලේඛය තවමත් ක්‍රියාත්මක නෑ

– ලීසිං හා ණය වාරික ගෙවන්නන්ගේ සංගමය

>>P2

හිස්බුල්ලාගේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන කටයුතු යළි ඇරඹෙයි

>>P2

බෞද්ධ ආගමික කටයුතුවලට පමණක් මුල්තැන දෙයි



හැම බඩුවටම ගැහුවේ වැට් පිට — වැට්ය
ඒ ගැන දුකින් තැන තැන කෙරෙනා — වැට්ය
පාලකයන් නෙවෙයි මුං රට කන — රැට්ය
මහජනතාව නමි දැන් හොඳටම — ෆ්ලැට්ය

ප්‍රියන්ත කොඩිප්පිලි

පොහොට්ටුවේ මහා සම්මේලනය අද

නවෝදය පවනි

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහා සම්මේලනය අද (15දා) සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ දී පැවැත්වේ. එහිදී පක්ෂයේ සභාපති, ලේකම් හා නායක යන තනතුරු හැර සෙසු තනතුරු සඳහා නව නිලධාරී මණ්ඩලයක් පත් කරගැනීමට නියමිතය. මෙහිදී නව විධායක කමිටුවක් ද පත් කරගැනීමට නියමිත බව වාර්තා විය.

එම පක්ෂයේ අයිතිය සම්බන්ධයෙන් පැවති නීතිමය කටයුතු සියල්ල අවසන් වීමෙන් පසුව පවත්වන පළමු සම්මේලනය මෙය වේ. ඉන් අනතුරුව හෙට (16දා) එම පක්ෂයේ නව විධායක සභාව රැස්වීමට ද නියමිතය.

රාගම වෙඩිතැබීමකින් 03කට තුවාල

>>P2

AA CEYLON Estd. 1904
Now open
FOOD
AUTO WHEEL
Restaurant and Lounge
Live Music in Attendane
Managed by :
Automobile Association of Ceylon
40, Sir M. M. M. Mawatha, Colombo-3
www.aaceylon.lk
Hotline - 0117555557
077 4369013 (Krishon)
RESERVATION ACCEPTED FOR PRIVATE FUNCTIONS

කාලගුණය

උපරිම උෂ්ණත්වය

31°C අනුරාධපුර

අවම උෂ්ණත්වය

12°C නුවරඑළිය



වැසි තත්ත්වය

නැගෙනහිර/ ඌව/ බස්නාහිර/ සබරගමුව/ දකුණු පළාත් හා පොළොන්නරුව/ මාතලේ/ මුලතිව්/ කිලිනොච්චිය/ යාපනය/ හම්බන්තොට/ වවුනියාව/ අනුරාධපුර යන දිස්ත්‍රික්කවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.



මිදුම් තත්ත්වය

බස්නාහිර/ සබරගමුව/ මධ්‍යම පළාත් හා ගාල්ල/ මාතර දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථානවල උදෑසන කාලයේදී මිදුම් තත්ත්වයක් පැවතිය හැකිය.

මුහුදේ තත්ත්වය

පොතුවිල් සිට මඩකලපුව, ත්‍රිකුණාමලය හා කන්කසන්තුරය හරහා මන්නාරම දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරම් සහිත වැසි ඇති වේ. සුළඟේ වේගය පැ.කි.මී. 25-35 පමණ වෙයි.

අදින්

කර්තෘ මණ්ඩලය

ඔපිනයා
අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.

දුරකථන
2479670, 2479671

ෆැක්ස්
2479668

වඳුන් තැපෑල
ada@wijeya.lk / adanewspaper@gmail.com

වෙළඳ දැන්වීම් අංශය
011 2479 830

සබඳතාවේ අංශය
011 2479 625

ප්‍රසරණ අංශය
011-2479 626

අදින්

පාඨක අයිතීන් සුරැකීම

අද පුවත්පත ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සහයෝගය දක්වයි.

මේ පුවත්පතෙහි සේවා කරන කර්තෘ ඇතුළු පත්‍රකලාවේදීන් සියලු දෙනම 'පාඨක අයිතීන් සුරැකීම' සහ පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ක්‍රියාවට නංවන 'කර්තෘ සංසදයට' අදාළ ආචාර ධර්ම සුරැකීමට නිබඳව බැඳී සිටිති. පුවත්පතේ පළකෙරෙන ප්‍රවෘත්තියක් නිසා ඔබට සිදුවන යම් අපහසුතාවක් පිළිබඳ අප පුවත්පත දැනුම්වත් කිරීමට අවස්ථාව ඇත.

ඒ පිළිබඳ ඔබ සැහීමකට පත් නොවන්නේ නම්, 'ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම' වෙතද ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.



ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
Press Complaints of Sri Lanka
96, කිරුළ පාර, කොළඹ 05.
දුරකතනය 5 353 635
ෆැක්ස් 5 335 500
ඉමේල් pccsl@pccsl.lk
වෙබ් www.pccsl.lk

හිස්බුල්ලාගේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන කටයුතු යළි ඇරඹෙයි

බෞද්ධ ආගමික කටයුතුවලට පමණක් මුල්තැන දෙයි

මනම්පිටිය -නිමල් ජයරත්න

කලක් සමාජයේ මහත් ආන්දෝලනයට තුඩු දුන් මඩකලපුව පූනානි පිහිටි නැගෙනහිර විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන කටයුතු ඊයේ (14දා) දහවල් බෞද්ධ ආගමික කටයුතුවලට පමණක් මුල් තැන දෙමින් එම විශ්වවිද්‍යාලයේ සභාපති එම්. එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා, උපකුලපති ඇතුළු කිහිපදෙනෙකුගේ සහභාගිත්වයෙන් ආරම්භ කෙරිණ.

ඒ අනුව ජනවාරි 18දා සිංහල, දමිළ, මුස්ලිම්, ඇතුළු සියලු ජාතීන් හා ආගම් නියෝජනය කරමින් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් කටයුතු ආරම්භ කරන බව විශ්වවිද්‍යාලයේ නිර්මාතෘ නැගෙනහිර පළාතේ හිටපු ආණ්ඩුකාර එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා පැවසීය.

මෙම විශ්වවිද්‍යාලය සඳහා දැනටමත් අයදුම්පත් තුන්දාහක් පමණ ලැබී ඇති අතර මෙහි දාහකට ආසන්න සිසුන් සංඛ්‍යාවකට, අධ්‍යාපනය ලබා දීමේ සියලු පහසුකම් පවතින බවත්, ලෝකයේ ජාත්‍යන්තර තලයේ පහසුකම් පවතින විශ්වවිද්‍යාලයක් බවට පත්කර ඇති බවත් හිස්බුල්ලා මහතා කීය. මෙහි අධ්‍යාපනය ලබන සිසුන්ට ණය පහසුකම් ලබාදීමට එම ස්ථානයේ බැංකු කිහිපයක් ආරම්භ කරන බවත්, එම සිසුන් ලබාගත් ණය රැකියා සිටුකරන අවස්ථාවලදී ගෙවීමට අවශ්‍ය පහසුකම් සලසා ඇති බවත් ඒ මහතා කීවේය.

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වත්මත් උපකුලපතිවරයා ලෙස මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර මහතා, මෙහිදී වැඩ භාරගත් අතර උතුරු මැද, නැගෙනහිර, ඌව යන පළාත්වල සිසුන්ට මෙන්ම සෙසු පළාත්වල විශ්වවිද්‍යාල වරම් තිබෙන දරුවන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකි බවත්, ජනවාරි මාසයේ සිට ඔවුන්ට අවශ්‍ය පහසුකම් සලසාදී අධ්‍යාපන ලබාදීමට කටයුතු කරන බවත් සඳහන් කළේය.

වැලිකන්ද ශාසනාරක්ෂක බල

මණ්ඩලයේ සභාපති, කඩවතමඩුව ශ්‍රී බෝධිරාජාරාමාධිපති ඉඩම්පිටියේ වජිරාලංකාර නාහිමියන් ප්‍රමුඛ ගරුතර මහා සංඝරත්නය මෙහිදී ආගමික වතාවත් සිදුකළහ. විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතුවලට ආශීර්වාද සිදුකිරීමේදී බෞද්ධ ආගමට මුල්තැන දීම පිළිබඳව තමාගේ ස්තුතිය පිරිනමන බවත්, නැගෙනහිර විශ්වවිද්‍යාලයට සිංහල, දමිළ, මුස්ලිම්, දරුවන් ඇතුළත් කරගනිමින්, රටට යහපත් පුරවැසියන් පිරිසක් බිහි කිරීමට හිස්බුල්ලා මහතා ඉදිරිපත්වීම පිළිබඳ තමන් වහන්සේ ප්‍රශංසා කරන බවත් මෙහිදී ඉඩම්පිටියේ වජිරාලංකාර නාහිමියෝ අනුශාසනාව සිදුකරමින් පැවසූහ.

2018 වර්ෂයේ දී නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතු අවසන් කෙරුණද සහරාන්ගේ ප්‍රහාරයත් සමග එම විශ්වවිද්‍යාලයේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වූ අතර,වසර දෙකකට ආසන්න කාලයක් එම විශ්වවිද්‍යාලය යුද හමුදාව යටතේ පාලනය විය. එම කාලය තුළ කොරෝනා මධ්‍යස්ථානයක් හා නීරෝධායන මධ්‍යස්ථානයක් ලෙස පැවැති නැගෙනහිර විශ්වවිද්‍යාලය පසුගිය ඔක්තෝබර් 20දා යුද හමුදාව විසින් නැවත වරක් එම විශ්වවිද්‍යාලයේ සභාපති හිස්බුල්ලා මහතාට භාර දෙන ලදි. මෙම අවස්ථාවට නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සභාපති, හිස්බුල්ලා මහතාගේ පුත් හිරාස් හිස්බුල්ලා මහතා ඇතුළු විශ්වවිද්‍යාලවල පිරිස් රැසක් සහභාගි වී සිටියහ.

සැහැල්ලු දුම්රිය නැවත ගේන්න ජපානය සමග සාකච්ඡා

නවෝද්‍යා පවනි

සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය ආරම්භ කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය තවදුරටත් ජපාන රජය සමග සාකච්ඡා කරමින් සිටින බව රජය පවසයි.

ශ්‍රී ලංකා රජය හා ජපාන රජය අතර පැවති සාකච්ඡාවකදී මෙම ව්‍යාපෘතිය යළි ඇස්තමේන්තු කිරීමේ අවධානය යොමුව තිබේ. කොවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් මේ සඳහා වැය වන මුදල මුල් ඇස්තමේන්තුවට වඩා ඉහළ යාම ඊට හේතුවයි.

කෙසේ වෙතත් ශ්‍රී ලංකා රජය හා ජපාන රජය සමග පැවති සාකච්ඡාවලදී ගනු ලබන තීරණ අනුව ලබන වසර තුළ පොදු පහසුකම් විතැන් කිරීම හා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය යළි සක්‍රීය කිරීමට හැකි වනු ඇතැයිද නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි. මෙම ව්‍යාපෘතිය කඩිනමින් යළි ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවද ඔහු පෙන්වා දෙයි.

සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය සඳහා මූලික ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර තිබිණ. එහි මාලබේ සිට පිටකොටුව දක්වා වන ඉදිකිරීම්වලට අදාළව



සවිස්තරාත්මක සැලසුම්, කොන්ත්‍රාත් ලේඛන, ලංසු ලේඛන ඇස්තමේන්තු හා අධීක්ෂණ සේවා සැපයීම සඳහා ජාත්‍යන්තර උපදේශන සමාගමක් පත් කෙරිණ. එම මූලික කටයුතු වෙනුවෙන් වෙන්කළ මුදල ඇමරිකානු ඩොලර් මිලියන 120කි.

මෙම මූලික කටයුතු 2019 අප්‍රේල් මාසයේදී ආරම්භ කෙරුණු අතර එය අවසන් වීමට තිබුණේ මාස 91කිනි. කෙසේ වෙතත් මාස 21ක උපදේශන කාල සීමාවෙන් පසු එනම් 2020 දෙසැම්බර් 31දා වනවිට ව්‍යාපෘතිය අවලංගු කිරීමට රජය තීරණය කර තිබේ. මෙම උපදේශන කටයුතු නතර කරන විට ව්‍යාපෘතියේ මූලික සැලසුම් 60%ක් අවසන්ව තිබුණු අතර විස්තර සැලසුම් 78%ක් අවසන්ව තිබේ. මාලබේ දක්වා පාංශු පරීක්ෂණ මෙන්ම පූර්ව ශක්‍යතා අධ්‍යයනය අවසන්ව තිබේ.

ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමද ආරම්භ කර ඇති අතර ඒ සඳහා හඳුනාගෙන ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 22කි. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය පවසන්නේ බොහෝ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් වී ඇති බවයි. එහෙත් අදාළ අත්පත් කරගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීමේ කටයුතු මෙතෙක් සිදු කර නොමැති බවයි.

සැහැල්ලු දුම්රිය සේවාව අවලංගු කිරීම හේතුවෙන් උපදේශන සේවා සඳහා පත්කළ සමාගම ඉල්ලා සිටි ආලාභහානි විශ්ලේෂණය කර ගතයුතු පියවර තීරණය කිරීමට ඇමති මණ්ඩලය සාකච්ඡා කමිටුවක් පත් කර ඇති අතර ජයිකා ආයතනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ලැබෙන ණය මුදලින් එය ගෙවීමට එකඟ වී තිබේ. එහෙත් ලබාගෙන ඇති ණය මුදල සක්‍රීය වී නොමැති නිසා ගෙවීම් සිදු කළ නොහැකි වී ඇතැයිද ඇමතිවරයා පෙන්වා දෙයි.

රාගම වෙඩිතැබීමකින් 03කට තුවාල

රාගම වල්පොල ප්‍රදේශයේ ඊයේ (14දා) රාත්‍රියේ සිදුවූ වෙඩිතැබීමකින් තිදෙනෙකු තුවාල ලබා තිබෙන බව පොලිසිය සඳහන් කරයි.

තුවාල ලැබූවන් අතර 17 හැවිරිදි තරුණයෙක්, කාන්තාවක් සහ පිරිමි පුද්ගලයෙක් සිටින අතර මෙම තිදෙනා රාගම රෝහලට ඇතුළත් කර තිබේ. අදාළ සිද්ධිය සම්බන්ධයෙන් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා පොලීසිය විශේෂ පරීක්ෂණයක් ආරම්භ කර තිබේ

සීසර්ලාගේ අනීතික වාහන අත්පත් කර ගැනීමට එරෙහිව

හිටපු පොලිස්පති චක්‍රලේඛය තවමත් ක්‍රියාත්මක නෑ

– ලීසිං හා ණය වාරික ගෙවන්නන්ගේ සංගමය

එච්. අයි. තුෂාර

ලීසිං වාරික කිහිපයක් ගෙවීම පැහැර හැරීම මත සීසර්ලා විසින් බලහත්කාරයෙන් වාහන අත්පත් කර ගැනීමේ කටයුතුවලට පොලිස් නිලධාරීන්ට සහාය ලබා දිය නොහැකි ලෙසට හිටපු පොලිස්පති චක්‍රලේඛයක් නිකුත් කළත් එම කටයුතු තවමත් සිදුවෙමින් තිබෙන බව ලීසිං හා ණය වාරික ගෙවන්නන්ගේ සංගමය සඳහන් කරයි.

හිටපු පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතා විසින් අදාළ චක්‍ර ලේඛය පසුගිය වසරේ දෙසැම්බර් 19දා නිකුත් කර තිබෙන බවත්, ඇතැම් පොලිස් නිලධාරීන් විසින් වාහන අත්පත් කර ගැනීමේ කටයුතුවලදී සීසර්ලාට තවමත් සහාය ලබා දෙමින් තිබෙන බවත් එම සංගමයේ සභාපති අසංක රුවන් පොතුපිටිය මහතා සඳහන් කළේය.

මේ වසරේ ජනවාරි 01දා සිට මේ මස 10දා දක්වා කාලය සැලකිමෙහිදී ලිසිං සමාගම් විසින් බලහත්කාරයෙන් යතුරු පැදි හා අනෙකුත් වාහන 50.000කට ආසන්න ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබෙන බවට වාර්තා වන බවද හෙතෙම පැවසීය.

ලිසිං වාරික කිහිපයක් නොගෙවීම මත වාහන අත්පත් කර ගැනීම් සිදුකරනු ලබනවා නම් අදාළ කටයුතු අධිකරණ ක්‍රියා මාර්ග හරහා සිදුකළ යුතු බවට නීති පවතින බවත්, බොහෝ ලීසිං ආයතන සිදුකරමින් තිබෙන්නේ සීසර්වරුන් ලෙස හඳුන්වන කණ්ඩායම යොදවා බලහත්කාරයෙන් වාහන අත්පත් කර ගැනීමට කටයුතු කිරීම බවත් අසංක රුවන් මහතා සඳහන් කළේය.

අදාළ කටයුතු සඳහා පොලිස් නිලධාරීන්ගේ සහාය පවා ලබා ගන්නා බවත්, මේ පිළිබඳව පොලිස් මූලස්ථානයට පවා පැමිණිලි කර තිබෙන බවත්, ගැටලුවට විසඳුම් නොලැබුණ හොත් කොළඹට පිරිස් කැඳවා විරෝධතා ව්‍යාපාර පැවැත්වීමට කටයුතු කරන බවත් හෙතෙම පැවසීය.

ශානිට ප්‍රමාණවත් ආරක්ෂාවක් දෙන්න

අභියාචනාධිකරණයෙන් පොලිස්පතිට නියෝග

බුද්ධිමාල් රුබේරු

ජීවිත තර්ජන එල්ල වී සිටින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර මහතාට දැනට ලබාදී තිබෙන ආරක්ෂාවට අමතරව වහාම ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබාදෙන ලෙස අභියාචනාධිකරණය පොලිස්පතිවරයා ඇතුළු ආරක්ෂක බලධාරීන්ට ඊයේ (14දා) නියම කළේය.

ඊළඟ මොහොතේ පවා තම සේවාදායකයාගේ ජීවිතයට අනතුරක් වීමේ අවදානමක් මේ මොහොත වනවිට උද්ගතව ඇතැයි පවසමින් ශානි අබේසේකර මහතා වෙනුවෙන් පෙනීසිටි ජනාධිපති නීතිඥ උපුල් ජයසූරිය මහතා කළ ඉල්ලීමක් පිළිගනිමින් අභියාචනාධිකරණය විලෙස නියම කළේය.

ජීවිත තර්ජන එල්ල වී සිටින තමන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබාදෙන ලෙස ආරක්ෂක බලධාරීන් වෙත නියෝගයක් නිකුත් කරන්නැයි ඉල්ලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර මහතා ගොනු කළ රිට් පෙත්සමේ වගඋත්තරකරුවන් වශයෙන් පොලිස්පතිවරයා, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්, වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය ඇතුළු පිරිසක් නම් කර අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න සහ විකුම් කළුආරච්චි යන මහත්වරුන්ගේ සමන්විත විනිසුරු මඬුල්ල හමුවේ මෙම පෙත්සම කැඳවනු ලැබිය.

වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනීසිටි අතිරේක සොලිසිටර් ජනරාල් රොහාන්ත අබේසූරිය මහතා කරුණු දක්වමින් පෙත්සම්කරුගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඉදිරිපත් කළ බුද්ධි තොරතුරු ඇතුළත් වාර්තාව අවශ්‍ය පියවර ගැනීම සඳහා මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කර ඇතැයිද ඊට අදාළ සුදුසු පියවර ගැනීම සඳහා මාසයක කාලයක් ලබාදෙන්නැයිද ඉල්ලා සිටියේය.

පෙත්සම්කාර ශානි අබේසේකර මහතා වෙනුවෙන් පෙනීසිටි ජනාධිපති නීතිඥ උපුල් ජයසූරිය මහතා කරුණු දක්වමින් මාසයක කාලයක් ගත වනවිට තම සේවාදායකයාට කුමක් සිදුවේදැයි සිතාගත නොහැකි බවත්, තම සේවාදායකයාට මේ වනවිට ලබාදී තිබෙන්නේ එක් පොලිස් නිලධාරියෙකු හා එක් යතුරුපැදියක් පමණක් බවත් එය ඔහුගේ ආරක්ෂාවට කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බවත් පවසා සිටියේය.

ඉදිරිපත් වූ කරුණු සලකා බැලූ අභියාචනාධිකරණය පෙත්සම්කරුට දී ඇති ආරක්ෂාවට අමතරව ප්‍රමාණවත් ආරක්ෂාවක් දීමට පියවර ගන්නා ලෙස ආරක්ෂක බලධාරීන්ට නියෝග කළ විනිසුරු මඬුල්ල පෙත්සම ජනවාරි මස 18වැනිදා යළි කැඳවීමට නියෝග කළේය.

ලොකු ලූනු කිලෝව රු.500 ඉක්මවයි

ඉන්දික කේවවිතාරණ

ලොකු ලූනු කිලෝවක මිල ඊයේ (14දා) වන විට රු.500 ඉක්මවා ගොස් තිබෙන බවත්, සියලුම භාණ්ඩවල මිල අධික ලෙස ඉහළ ගොස් තිබෙන බවත් ජාතික කාන්තා එකමුතුව සඳහන් කරයි.

මෙම තත්ත්වය පාලනය කිරීමේ හැකියාව ආණ්ඩුවට තිබියදීත් එය සිදු නොවන බවත්, පවතින තත්ත්වය නිසා දරුවන්ට පෝෂ්‍යදායී ආහාර ටිකක් ලබාදීමට නොහැකි වීමෙන් මව්වරුන් දැඩි ලෙස අසරණ වී සිටින බවත් එම එකමුතුවේ සභාපතිනි හෂිනි සිල්වා මහත්මිය සඳහන් කළාය.

පොල් ගෙඩියක මිල රු. 120 -රු.130 පමණ බවත්, සහල් කිලෝවක මිල රුපියල් 220කට වැඩි බවත්, බිත්තරයක



මිල රුපියල් 62ක් බවත්, කුකුළු මස් මිල ඇතුළු සෑම භාණ්ඩයකම මිල අධික ලෙස ඉහළ ගොස් තිබෙන බවත් ඇය පැවසුවාය.

ඊයේ(14දා) කොළඹ පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී මේ බව සඳහන් කළ සභාපතිනිය වැඩිදුරටත් සඳහන් කළේ ජනවාරි 01 දා අලුතින් එකතුවන වැට් බදු නිසා භාණ්ඩ මිල තවදුරටත් ඉහළ යන බවය. මේ නිසා භාණ්ඩ මිල පාලනය කර ජනතාවට සහන ලබා දීමට ආණ්ඩුව කටයුතු කළ යුතු බවත්, පවතින තත්ත්වය තුළ කාන්තාවන් හා මව්වරුන් දැඩි ලෙස අසරණ වී සිටින බවත් ඇය සඳහන් කළාය.

පවතින තත්ත්වය පාලනය කර ගැනීමට නොහැකි වුවහොත් දැනට පවතින මන්දපෝෂණ තත්ත්වය තවදුරටත් ඉහළ යන බවත්, තුන්වේලක් කෑ ජනතාව මේ වන විට දිනකට වේල් දෙකක් කන තත්ත්වයට පත් වී තිබෙන බවත්, වේල් දෙකක් කෑ ජනතාව එක් වේලක් කන තත්ත්වයට පත් වී සිටින බවත් හෂිනි සිල්වා මහත්මිය පැවසුවාය.

බන්ධනාගාර නිලධාරීන් 19කට උසස්වීම්

ඉන්දික කේවාවිතාරණ

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 19ක් උසස්වීම් ලබාදුන් බව බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක බන්ධනාගාර කොමසාරිස් ගාමිණී බී. දිසානායක මහතා සඳහන් කළේය.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ජේලර් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා පසුගිය මස 28වැනිදා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබෙන අතර, මේ අනුව අදාළ උසස්වීම් ලබාදී ඇත.

එහිදී, පළමු පෙළ ජේලර් තනතුරේ අවුරුදු 05කට වැඩි සතුටුදායක සේවා කාලයක් ඇති නිලධාරීන් අතුරින් ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත වැඩිම ලකුණු ලබාගත් නිලධාරීන් 19ක් ප්‍රධාන ජේලර් තනතුරට උසස් කර තිබේ.

ගෙවීම පැහැරහැර තිබෙන රු. බි. 4100ක බදු මුදල අයකර ගැනීමට මැදිහත් වන්නැයි පා.ම. 225න් ඉල්ලනවා

-ආර්ථික යුක්තිය උදෙසා ජනතා සාමූහිකය

● ඉන්දික කේවාවිකාරණ

වැට් බදු ඇතුළු විවිධ බදු වර්ග ජනතාව මත පැටවීම නතර කර, ගෙවීම පැහැරහැර තිබෙන රුපියල් බිලියන 4100ක මුදල කඩිනමින් අයකර ගැනීමේ වැඩපිළිවෙළක් සකස් කරන ලෙසට පාර්ලිමේන්තුව නියෝජනය කරන 225 දෙනාගෙන්ම ඉල්ලා සිටින බව ආර්ථික යුක්තිය උදෙසා ජනතා සාමූහිකය සඳහන් කරයි.

ජනතාව මත අධික ලෙස බදු බර පටවා තිබෙන බවත්, පැහැරහැර තිබෙන බදු මුදල් අයකර ගැනීමේ කිසිදු වැඩපිළිවෙලක් මෙතෙක් සකස් කර නොමැති බවත් එම සංවිධානයේ විධායක සභික දර්ශන තන්ත්‍රීගේ මහතා සඳහන් කළේය.

බදුගෙවීම් පැහැරහැර ඇති පුද්ගලයන්ගෙන් බදු අයකර ගන්නා ලෙස ඉල්ලා ඊයේ (14දා) මෙම සංවිධානයේ නියෝජිතයන් හා සිවිල් සංවිධාන නියෝජිතයෝ එක්බද්ධ වී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉදිරිපිට සත්‍යග්‍රහයක නිරත වූහ. එම අවස්ථාවට සහභාගිවෙමින් මේ බව සඳහන් කළ දර්ශන තන්ත්‍රීගේ මහතා වැඩිදුරටත් සඳහන් කළේ ගෙවීම් පැහැරහැර ඇති බදු අයකර ගැනීමට පවතින නීති ප්‍රමාණවත් නොවනවා නම් පාර්ලිමේන්තුව තුළ නව නීති සකස් කර හෝ අදාළ මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු බවය.

අදාළ ඉල්ලීම් මුල් කර ගනිමින් පසුගිය මස 14 දා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව ඉදිරිපිට මල්වඩම් තබා විරෝධතා පැවැත් වූ බවත්, දෙවැනි ක්‍රියා මාර්ගය ලෙස සත්‍යග්‍රහ ව්‍යාපාරයක් ඊයේ පැවැත් වූ බවත්, ඉදිරි ක්‍රියා මාර්ග මීට වඩා දැඩි විය හැකි බවත් හෙතෙම සඳහන් කළේය.

බුවනෙකබා රාජසභා මණ්ඩපය කැඩූ කුරුණෑගල හි.නගරාධිපති සහ 4ක් අවුරුදු 3ක් හිරේට

හිටපු නාගරික කොමසාරිස්, හිටපු නාගරික ඉන්ජිනේරු, හිටපු වැඩ පරීක්ෂක සහ බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුවන් ඒ අතර

සැකකරුවන් වරද පිළිගනී

අලාභ හානියට ගෙවන්න කී රු.එක්කෝටි තිස්හත් ලක්ෂ පනස් දහසක වන්දි මුදල හා දඩ මුදල් ඒ මොහොතේම ගෙවයි

● බුද්ධිමාල් රුබේරු/ ගීකාංජලී ප්‍රියදර්ශනී/ ජනූර් කිව්ලාන්

බුවනකබාහු රාජ සමයට අයත් බව සැලකෙන කුරුණෑගල පිහිටි රාජසභා මණ්ඩපය කඩා අලාභ හානි කිරීමේ චෝදනාවට වරද පිළිගත් කුරුණෑගල හිටපු නගරාධිපතිවරයා ඇතුළු පස්දෙනෙකුට කුරුණෑගල මහාධිකරණ විනිසුරු ලාල් බණ්ඩාර මහතා වසර 03 බැගින් බරපතළ වැඩ සහිත සිරදඬුවම් ඊයේ (14දා) නියම කළේය.

සිරදඬුවමට අමතරව රාජසභා මණ්ඩපයට කළ අලාභ හානිය සම්බන්ධයෙන් රුපියල් එක්කෝටි තිස්හත් ලක්ෂ පනස් දහසක වන්දි මුදලක් ගෙවීමටද විත්තිකරුවන්ට නියම කළ විනිසුරුවරයා රුපියල් දෙලක්ෂ විසිපන්දහස බැගින් දඩ මුදල් ගෙවීමටද විත්තිකරුවන්ට නියම කළේය.

රාජසභා මණ්ඩපයට කළ හානිය වෙනුවෙන් ගෙවීමට නියම කළ රුපියල් එක්කෝටි තිස්හත් ලක්ෂ පනස් දහසක මුදල කුරුණෑගල හිටපු නගරාධිපති තුෂාර සංජීව විතාරණ මහතා විසින් ඒ අවස්ථාවේදීම ගෙවනු ලැබූ අතර, ඔවුන්ට නියම කළ දඩ මුදල්ද විත්තිකරුවෝ ඒ අවස්ථාවේදීම ගෙවා දමනු ලැබූහ.

මෙය ලංකාවේ පෞරාණික ස්ථානයක් බව දැන දැනම මෙයට අලාභ හානි කිරීම සුළුවෙන් තැකිය නොහැකි හෙයින් විත්තිකරුවන්ට උපරිම දඬුවම් නියම කරන්නැයි නීතිපතිවරයා වෙනුවෙන් පෙනීසිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් මාධව තෙන්නකෝන් මහතා කළ ඉල්ලීමක් පිළිගනිමින් විත්තිරුවන්ට මෙලෙස දඬුවම් නියම කෙරිණි.

චෝදනාවන්ට වරද පිළිගැනීම නිසා මෙලෙස දඬුවම් නියම වූයේ, කුරුණෑගල හිටපු නගරාධිපති තුෂාර සංජීව විතාරණ, හිටපු නාගරික කොමසාරිස් ප්‍රදීප් නිශාන්ත තිලකරත්න, හිටපු නාගරික ඉන්ජිනේරු චමින්ද බණ්ඩාර අධිකාරී, හිටපු වැඩ පරීක්ෂක ඉලාලුදීන් සුල්ෆිකාර් සහ බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු ලෙස කටයුතු කළ ලක්ෂ්මන් ප්‍රියන්ත නමැත්තන්ටය.

2020 ජූලි 14වැනිදා හෝ ඊට ආසන්න දිනයක කුරුණෑගලදී කුරුණෑගල නගර සභාව සතු දේපළ වන කුරුණෑගල - දඹුල්ල මාර්ගයේ පිහිටි බුවනකබාහු රාජ සමයට අයත් බව සැලකෙන කුරුණෑගල නගර මධ්‍යයේ පිහිටි රාජසභා මණ්ඩපය කඩාදැමීම සඳහා කුමන්ත්‍රණය කිරීම, ඒ අනුව අදාළ රාජසභා මණ්ඩපය කඩා අනර්ථයක් කර රුපියල් හැත්තෑදෙලක්ෂ පනස් දහසක පාඩුවක් කිරීම, ඒ සඳහා ආධාර අනුබලදීම ඇතුළු චෝදනා 5ක් යටතේ විත්තිකරුවන්ට එරෙහිව නීතිපතිවරයා විසින් නඩු පවරා තිබිණි.

මෙම සිද්ධියට අදාළව විත්තිකරුවන් අත්අඩංගුවට ගන්නා ලෙස කුරුණෑගල හිටපු මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබ තිබියදී එම නියෝගය අත්හිටුවමින් අභියාචනාධිකරණය විසින් තීන්දුවක් ලබාදී තිබිණි.

එසේ තිබියදී පොලිසිය විසින් කුරුණෑගල මහේස්ත්‍රාත් බන්දුල ගුණරත්න මහතා හමුවට කරුණු වාර්තා කර තිබූ අතර, මහාධිකරණය හමුවේ චෝදනා ගොනු කිරීමෙන් පසු එහි පෙනීසිටීමේ කොන්දේසිය මත විත්තිකරුවන්ට ඇප නියම කර තිබිණි.

ඒ අනුව ඊයේ මෙම නඩුව කැඳවනු ලැබූ අස්ථාවේදී විත්තිකරුවෝ අධිකරණයේ පෙනී සිටියහ. ඒ අවස්ථාවේදී විත්තිකරුවන්ට එරෙහි චෝදනා විවෘත අධිකරණයේදී ඔවුන්ට කියවා දෙනු ලැබූ අවස්ථාවේදී විත්තිකරුවන් වෙනුවෙන් පෙනීසිටි ජනාධිපති නීතිඥ, රියෙන්සි අර්සකුලරත්න මහතා ඇතුළු නීතිඥවරු කරුණු දක්වමින් තම සේවාදායකයන් අදාළ චෝදනාවන්ට මුල් අවස්ථාවේදීම වරද පිළිගන්නා බවද දැනුම් දුන්හ.

අධිකරණයේ කාලය මිඩංගු නොකරන මුල් අවස්ථාවේදීම වරද පිළිගත් තම සේවාදායකයන්ට යහපත් පුරවැසියන් ලෙස යළි සමාජගත වීමට හැකි වන අයුරින් ලිහිල් දඬුවමක් නියම කරන්නැයි ඉල්ලා සිටියහ.

පැමිණිල්ල වෙනුවෙන් නීතිපතිවරයා නියෝජනය කරමින් පෙනීසිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් මාධව තෙන්නකෝන් මහතා කරුණු දක්වමින් විත්තිකරුවන් කර ඇත්තේ, කිසිදා පිරිමැහිය නොහැකි පාඩුවක් යැයි පැවසීය.

වසර දහස් ගණනක් පැරණි අපේ රජදරුවන් විසින් කරන ලද මෙම රාජසභා මණ්ඩපය මුළු ලංකාවට අයත් පුරාවස්තුවක් යැයි පැවසූ මාධව තෙන්නකෝන් මහතා, රටේ පුරාවස්තු විනාශ කිරීම සහ කොල්ලකෑම රටේ කලාවක් වී ඇතැයිද පෙන්වා දුන්නේය.

මින් මතුවට හෝ මෙවැනි අපරාධ කිරීමෙන් සමාජය වළක්වාගත හැකි වන අන්දමට මෙම විත්තිකරුවන්ට දැඩි දඬුවම් නියම කරන්නැයි ඉල්ලා සිටියේය. දීර්ඝ වේලාවක් පුරා දෙපාර්ශ්වයේ නීතිඥවරු ඉදිරිපත් කළ කරුණු සලකා බැලූ විනිසුරුවරයා, රාජසභා මණ්ඩපයට කළ හානිය වෙනුවෙන් රුපියල් එක්කෝටි තිස්හත් ලක්ෂ පනස්දහසක වන්දියක් ගෙවීමට නියම කළේය.

ඊට අමතරව රාජසභා මණ්ඩපය අනර්ථය කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීම වෙනුවෙන් විත්තිකරුවන් පස්දෙනාට රුපියල් 25,000 බැගින් වෙන වෙනම දඩ නියම කළ අතර, සෙසු චෝදනාවන්ට රුපියල් 50,000 බැගින් දඩ නියම කෙරිණි.

දඩ මුදල් නොගෙවිවහොත් වසර බැගින් අමතර ලිහිල් වැඩ ඇතුව සිරදඬුවම් නියම කළ විනිසුරුවරයා, විත්තිකරුවන් සියලු දෙනාටම වසර බැගින් බරපතළ වැඩ ඇතිව සිරදඬුවම් නියම කෙරිණි.

පැමිණිල්ල වෙනුවෙන් නීතිපතිවරයා නියෝජනය කරමින් රජයේ නීතිඥ, සවිනි ඉද්දමල්ගොඩ, ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ, පත්මාල් ද සිල්වා සමඟ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් මාධව තෙන්නකෝන් මහතා පෙනී සිටියේය.

විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥවරු මඩුල්ලක් සමඟ ජනාධිපති නීතිඥ, රියෙන්සි අර්සකුලරත්න මහතා පෙනී සිටියේය.

සිද්ධියට අදාළ විමර්ශන සිදුකළ කුරුණෑගල විශේෂ අපරාධ විමර්ශන අංශයේ පොලිස් පරීක්ෂක සමන් බණ්ඩාර මහතා පැමිණිල්ලට සහාය දෙමින් අධිකරණයේ පෙනී සිටියේය.

හිටපු හමුදා සෙබළෙකුගේ මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කරලා

වැ.බ.පොලිස්පති දේශබන්දු ඇතුළු පොලිසියේ 4කට ලක්ෂ 5ක් බැගින් ගෙවන්න වෙයි

● බුද්ධිමාල් රුබේරු

හිටපු හමුදා සෙබළෙකු නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගෙන රඳවාගෙන වධහිංසා කිරීමෙන් වත්මන් වැඩ බලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් ඇතුළු පොලිස් නිලධාරීන් සිව්දෙනකු ඔහුගේ මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇතැයි තීන්දු කළ ශ්‍රේෂ්ඨාධිකරණය වගඋත්තරකරුවන් සිය පෞද්ගලික මුදල්වලින් රුපියල් ලක්ෂ 05 බැගින් පෙත්සම්කරුට වන්දි ගෙවිය යුතු බවට ඊයේ (14දා) නියම කළේය.

වන්දි මුදල් මාස හයක් තුළ ගෙවා අවසන් කළ යුතු බවට තීන්දු කළ ශ්‍රේෂ්ඨාධිකරණය වැඩ බලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් ඇතුළු පොලිස් නිලධාරීන් තිදෙනා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට නඩු තීන්දුවේ පිටපත් ජාතික පොලිස් කොමිසම සහ නීතිපතිවරයා වෙත යොමු කිරීමටද වැඩිදුරටත් නියම කළේය. පොලිස් නිලධාරීන්ට ලැබී තිබෙන "තරු පට්" බලය පෙන්වන ආභරණ නොවන බවත්, ඒවා හුදු වගකීමේ සංකේත බව සිහි තබාගත යුතු බවත් අදාළ මූලික අයිතිවාසිකම් පෙත්සමේ තීන්දුව ප්‍රකාශයට පත් කරමින් විනිසුරු තුරෙයිරාජා මහතා සඳහන් කළේය.

එවක නුගේගොඩ ප්‍රදේශය භාරව සිටි පොලිස් අධිකාරීවරයා වශයෙන් කටයුතු කළ වත්මන් වැඩ බලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාට අමතරව මෙලෙස වන්දි ගෙවීමට නියම කරන ලද්දේ

මිරිහාන පොලීසියේ හදිසි ඒකකයේ ස්ථානාධිපති භාතිය ජයසිංහ, පොලිස් නිලධාරී බණ්ඩාර සහ සිවිල් පුද්ගලයකු වන අජිත් වනසුන්දර නමැත්තන්ටය. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම වෙනුවෙන් මෙලෙස වන්දි ගෙවීමට නියම වූයේ මිල්ලව ප්‍රදේශයේ පදිංචි ඩබ්ලිව්. රංජිත් සුමංගල නමැති හිටපු හමුදා සෙබළෙකුටය.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුන් වන එස්. තුරෙයිරාජා, කුමුදුනී වික්‍රමසිංහ, ප්‍රියන්ත ප්‍රනාන්දු යන මහත්ම මහත්මීන්ගෙන් සැදුම්ලත් විනිසුරු මඩුල්ලක් හමුවේ මෙම පෙත්සම විභාග කෙරිණ.

දීර්ඝ නඩු විභාගයකින් අනතුරුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් වන කුමුදුනී වික්‍රමසිංහ, ප්‍රියන්ත ප්‍රනාන්දු යන විනිසුරුවරුන්ගේ එකඟත්වය ඇතිව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එස්. තුරෙයිරාජා මහතා විසින් මෙම තීන්දුව ප්‍රකාශයට පත් කෙරිණ.

2010 දෙසැම්බර් 18 දා අජිත් වනසුන්දර නමැති සිවිල් පුද්ගලයා සමඟ ත්‍රිරෝද රථයකින් පැමිණි මිරිහාන පොලීසියේ සේවය කළ බණ්ඩාර සහ භාතිය ජයසිංහ යන නිලධාරීන් දෙදෙනා තමන් අත්අඩංගුවට ගෙන දඹර ප්‍රදේශයේ සුසාන භූමියකට රැගෙන ගොස් මිරිස් කුඩු තැවරූ ප්ලාස්ටික් මලු දෙකක් තමන්ගේ හිසට බහා එහිදී තමන්ට අමානුෂික ලෙස පහර දුන් බවත්, එසේ පහර දෙමින් ප්‍රදේශයේ සිදුවන මංකොල්ලකෑම් හා යුද හමුදාවේ සිටියදී භාවිත කළ ගිනිඅවිය පිළිබඳව ප්‍රශ්න කළ බවත් සඳහන් කරන පෙත්සම්කරු භීතියට පත් තමා පොලිස් නිලධාරීන් විල්ල කළ චෝදනාවලට වරද පිළිගත් බවත් සඳහන් කළේය.

දීර්ඝ නඩු විභාගයකින් අනතුරුව තීන්දුව ප්‍රකාශයට පත්කළ විනිසුරු මඩුල්ල නඩුවේදී ඉදිරිපත් වූ සියලු කරුණු පිරික්සීමේදී වගඋත්තරකාර පොලිස් නිලධාරීන් ඉදිරිපත් කළ කරුණු චකිනෙකට පරස්පර එහෙයින් ඒවා ප්‍රතික්ෂේප කරන බව සඳහන් කළේය.

නීති විරෝධී අත්අඩංගුවට ගැනීම් හා වධ හිංසා කිරීම්වලට එරෙහිව මීට පෙරද අවස්ථා ගණනාවකදී ශ්‍රේෂ්ඨාධිකරණය මාර්ගෝපදේශ නිකුත් කළත් එවා "බිහිරන්ට වීණා" වාදනය කළ මෙන් බව අවධාරණය කළ ශ්‍රේෂ්ඨාධිකරණය මෙම සිද්ධියේදී නීතියේ ආධිපත්‍යය අවම මට්ටමින් හෝ පවත්වාගෙන යාමට වගඋත්තරකාර පොලිස් නිලධාරීන් කටයුතු කළ බවක් පෙනෙන්නට නැතැයි සඳහන් කළේය.

මෙම නඩුවට පාදක සිද්ධිය හුදෙකලා සිද්ධියක් නොවන බවත්, කාලාන්තරයක් තිස්සේ සිදුවෙමින් පවතින ආයතනික ගරා වැටීමක තවත් දිගුවක් බවත් තීන්දුවේ සඳහන් කළ විනිසුරු මඩුල්ල මිරිහාන පොලීසියේ හදිසි ඒකකයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක භාතිය ජයසිංහ සහ පොලිස් නිලධාරී බණ්ඩාර යන නිලධාරීන් පෙත්සම්කරු වධ හිංසනයට ලක් කර තිබෙන ආකාරය මෙන්ම සිද්ධිය වූ අවස්ථාවේදී ප්‍රදේශය භාරව කටයුතු කළ පොලිස් අධිකාරී දේශබන්දු තෙන්නකෝන් මහතා පෙත්සම්කරු රඳවා සිටි ස්ථානයට පැමිණ රබර් පටියකින් ඔහුට පහර දී ඇති අයුරු සහ පෙත්සම්කරු නිරුවත් කරන ලෙස අණ කර ඇති ආකාරය නඩු විභාගයේදී ඔහු සඳහන් කළේය.

පොලීසියේ පහළ නිලධාරීන්ට ලැබී තිබෙන බලය අව භාවිත කිරීම වැළැක්වීමට ඉහළ නිලධාරීන් වග බලාගත යුතු යැයි සඳහන් කළ විනිසුරු තුරේරාජා මහතා තමන් යටතේ සිටින නිලධාරීන්ගේ හැසිරීම සුපරීක්ෂණයට ලක් කිරීමේ වගකීම ඉහළ නිලධාරීන්ට තිබෙන බවද අවධාරණය කළේය . මෙහිදී පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ විරාන් කොරයා මහතා පෙනී සිටියේය.

පන්නිපිටිය ධර්මපාල ආදි සිසු 'ආයෙත් ඉස්කෝලෙ යං' හෙට

පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය සංවිධානය කරන 'ආයෙත් ඉස්කෝලෙ යං' (Palians Back to School) වැඩසටහන දෙසැම්බර් 16දා සෙනසුරාදා (හෙට) පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ දී පැවැත්වේ.

මෙම වැඩසටහන උදෑසන 7.30 සිට සවස 4.30 දක්වා පැවැත්වෙන අතර එම කාලය තුළ විවිධ වැඩසටහන් සංවිධානය කර තිබේ.පාසලේ ඉගැන්වූ ගුරු මහත්ම මහත්මීන් හා විදුහල්පතිවරුද සහභාගී වන මෙම අවස්ථාවට දිවයිනේ විසිර සිටින සියලුම ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විවෘත බව ආදි ශිෂ්‍ය සංගමය දන්වා සිටී. වැඩි විස්තර 0112843207,0717843207 දුරකථන අංකවලින් දැනගත හැකිය

ලෙබනන් ජාතිකයාගේ ඩොලර් 14,000ක් සොරාගත් චීන ජාතිකයා සොයයි

● (කටුනායක -ඒ.සේ.කේ.කපිල)

ගුවන් සේවයේ යානයක ව්‍යාපාරික පංතියේ පැමිණි ලෙබනන් ජාතිකයෙකුගේ අත් බෑගයේ තිබූ රුපියල් ලක්ෂ 50ක් පමණ වටිනා ඇමෙරිකානු ඩොලර් 14,000ක මුදලක් සොරාගත් චීන ජාතිකයා අත්අඩංගුවට ගැනීමට කටුනායක ගුවන් තොටුපොළ පොලීසිය සහ ගුවන් තොටුපොළ සංචාරක පොලීසිය පෙරේදා (13දා) රාත්‍රී ඒකාබද්ධ මෙහෙයුමක් ආරම්භ කර තිබේ.

47 හැවිරිදි ලෙබනන් ජාතික ව්‍යාපාරිකයකු සිය මවට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා ඇය සමඟ පෙරේදා (13දා) උදෑසන 07.20ට ගුවන්ගුවන් සේවයේ මස්කට් නුවර සිට ගුවන් සේවයේ ගුවන් යානයකින් කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණ තිබේ. මෙම ව්‍යාපාරිකයා සහ ඔහුගේ මව ගුවන් යානයේ ව්‍යාපාරික පංතියේ ආසනවල පැමිණ තිබූ අතර, ඔවුන් සමඟ චීන ජාතිකයෙකු ඇතුළු තවත් තිදෙනකු ද පැමිණ තිබුණි.

මෙම ලෙබනන් ජාතික ව්‍යාපාරිකයාගේ අත් බෑගය ගුවන් යානය තුළ, මගී ආසනවලට ඉහළින් ඇති ගමන් මලු රඳවනයෙහි තැබීමට පියවර ගෙන ඇත. ගුවන් යානය රාත්‍රී කාලයේ ගමන් කරමින් තිබූ අතර, එහි විදුලි පහන් නිවා දමා, ගුවන් මගීන්ට සුවදායක නින්දක් සඳහා අවශ්‍ය පසුබිම සකස් කර තිබුණි.

මේ අවසරයෙන්, මෙම ගුවන් යානයේ ව්‍යාපාරික පංතියේ සිටි චීන ජාතිකයා, ලෙබනන් ජාතික ව්‍යාපාරිකයාගේ අත් බෑගය විවෘත කර, එහි වූ මුදල් පසුම්බියේ තිබූ ඇමෙරිකානු ඩොලර් 14,000ක මුදල සොරාගෙන, ඒ වෙනුවට ඊජිප්තු මුදල් ඒකකයේ පහේ නෝට්ටු 18ක මිටියක්, එම මුදල් පසුම්බිය තුළට දමා තිබේ. මේ කිසිවක් නොදත් ලෙබනන් ව්‍යාපාරිකයා, ගුවන් යානයෙන් බැස කටුනායක ගුවන් තොටුපොළ පැමිණීමේ පර්යන්තයේ වූ බැංකු වෙත පැමිණියේ සිය ඇමෙරිකානු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට මාරු කර ගැනීමටය.

ඔහු තම පසුම්බියේ වූ ඇමෙරිකානු ඩොලර් 14,000 ක මුදල අස්ථානගත වීම පිළිබඳ කටුනායක ගුවන් තොටුපොළ සංචාරක පොලීසිය සහ ගුවන් තොටුපොළ පොලීසිය වෙත පැමිණිලි කර තිබුණි. පොලීසිය ගුවන් යානා කාර්යමණ්ඩලය සමඟ සිදු කළ මූලික විමර්ශනවලදී මෙම චීන ජාතිකයා මෙම මුදල් තොගය සොරා ගෙන ඇති බව තහවුරු කරගෙන ඇත.

ඒ අනුව දැනට අතුරුදන් වී ඇති චීන ජාතිකයා අත්අඩංගුවට ගැනීමට විමර්ශන කටයුතු ආරම්භ කර තිබෙන අතර කටුනායක ගුවන් තොටුපොළ පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක වල්මෝ මැල්කම් පේට් මහතාගේ උපදෙස් සහ අධීක්ෂණය මත ගුවන් තොටුපොළ සංචාරක පොලීසියේ පොලිස් පරීක්ෂක ධම්මික ඇතුළු පිරිසක් පරීක්ෂණ සිදු කරමින් සිටිති .

රු.කෝටි 107ක් වටිනා හෙරොයින් විනාශ කරයි

පුත්තලම - හිරාන් ප්‍රියංකර ජයසිංහ

මෙරටට රැගෙන එමින් තිබියදී අත්අඩංගුවට ගෙන අධිකරණ කටයුතුවලින් පසු කොළඹ අධිකරණ භූමියෙහි රඳවා තිබූ රු.කෝටි 107ක් වටිනා හෙරොයින් කිලෝ 107ක් පුත්තලම මහේස්ත්‍රාත් මිහිල් චිරන්ත සතුරුසිංහ මහතා ඉදිරියේ පුත්තලම පාලවිය සිමෙන්ති නිෂ්පාදන කර්මාන්ත ශාලාවේදී පුලුස්සා විනාශ කිරීම ඊයේ (14දා) සිදුවිය.

මෙසේ විනාශ කෙරුණේ 2019 වසරේ දී මුහුදු මාර්ගයෙන් මෙරටට රැගෙන එමින් තිබූ හෙරොයින් කිලෝ 107කි.

අදාළ හෙරොයින් තොගය රැගෙන එමින් සිටි ඉරාන ජාතිකයන් හත් දෙනෙකුද අත් අඩංගුවට ගෙන තිබූ අතර, ඔවුන් සම්බන්ධ අධිකරණ කටයුතු අවසන් වීමෙන් පසු ඔවුන් සන්තකයෙහි තිබූ හෙරොයින් තොගය මෙලෙස කොළඹ අධිකරණයෙහි සිට ඊයේ (14දා) විශේෂ පොලිස් හා පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරීන්ගේ හා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයෙහි නිලධාරීන්ගේ විශේෂ අධීක්ෂණයකින් පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාවට රැගෙන විත් අධිදහනයකින් සමන්විත උදුනට දමා විනාශ කිරීම සිදුවිය.

මෙලෙස විනාශ කෙරුණු හෙරොයින් තොගය රජයේ රස පරීක්ෂකවරිය ඉදිරියෙහිදී පරීක්ෂාවට ලක්වූ අතර හෙරොයින් තොගය විනාශ කිරීමට පෙර රස පරීක්ෂක දෙපාර්තුමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් එහි සාම්පල පරීක්ෂා කිරීම සිදුවිය.

එම සාම්පල පරීක්ෂා කිරීමෙන් පසු ලීටර් 500ක ජල බහාලුම් වල ජලය සමග දිය කර ඉන් සෙල්සියස් අංශක 2300ක උෂ්ණත්වයකින් යුත් උදුන වෙත රැගෙන ගොස් එහිදී විනාශ කිරීම සිදුවිය.

හෙරොයින් විනාශ කළ පුත්තලම පාලවි සිමෙන්ති කර්මාන්තශාලා පරිශ්‍රයට පොලිස් හා පොලිස් විශේෂ කාර්ය බළකා ආරක්ෂාවක් යොදවා තිබුණි.

මෙම අවස්ථාවට වයඹ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කිත්සිරි ජයලත් මහතා සමග පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයෙහි අධ්‍යක්ෂවරයාද එක්ව සිටියේය. මෙම අවස්ථාවට අදාළ පහසුකම් සැපයීම පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාවේ පාලනාධිකාරිය විසින් කර තිබුණි.

එළඹෙන අවුරුද්ද ජනතාවට ජීවත් වීමට ඉතා අපහසු, ආර්ථිකය කඩා වැටෙන අවුරුද්දක්

- ස.ජ.ආ මහලේකම්, පා.ම. රංජිත් මද්දුමබණ්ඩාර

දිනේෂ සමරකෝන්

එළඹෙන අවුරුද්ද ජනතාවට ජීවත් වීමට ඉතා අපහසු, ආර්ථිකය කඩා වැටෙන අවුරුද්දක් වන බව සමගි ජන බලවේගයේ මහලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුමබණ්ඩාර මහතා පැවසීය.

කොළඹ විපක්ෂනායක කාර්යාලයේ ඊයේ (14දා) පැවති මාධ්‍ය හමුවකට එක්වෙමින් හෙතෙම මේ බව සඳහන් කළේය. එහිදී වැඩිදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුමබණ්ඩාර මහතා මෙලෙස අදහස් දක්වා සිටියේය.

"සාමාන්‍යයෙන් ජනතාව අයවැයක් දෙස බලා සිටින්නේ තමන්ට සහනයක් ලැබෙයි, තමන්ට ලබන අවුරුද්දේ හොඳින් ඉන්න පුළුවන් වෙයි කියලා. අපි දන්නවා අපේ ඉතිහාසයේ අමාරුම අවුරුද්ද, ජනතාවට ජීවත්වීමට අපහසු, ජනතාව පහළට වැටුණු අවුරුද්දක් තමයි මේ 2023 වසර. අපි කියනවා එක පැත්තකින් අපි අයි.එම්.එෆ්. එකේ සියලු ඉල්ලීම් ඉෂ්ට කළා, අපි ආර්ථිකය හදනවා, අපි ආර්ථිකය යම් තැනකට ගෙනල්ලා තිබෙනවා කියලා. ජනතාව මේවා කියනකොට බලාපොරොත්තු වුණා අපිට යම් යම් සහන ලැබෙයි කියලා. රනිල් වික්‍රමසිංහ මහත්මයා කිව්වා වැල් පාලමෙන් බොහොම අමාරුවෙන් ගොඩ වුණා කියලා. දැන් වැල් පාලමෙන් ගොඩ වෙලා කොහේටද ගිහින් තියෙන්නේ? ලබන අවුරුද්ද ජනතාවට ජීවත් වීමට ඉතා අපහසු ආර්ථිකය කඩා වැටෙන අවුරුද්දක් වෙනවා.

අද ආණ්ඩුව අයවැය ආදායම් වැඩි කර ගන්න, ඒ ආදායම ජනතාවගෙන් අය කර ගන්න කටයුත්තක් අද කරලා තියෙනවා. වැට් එක ගැන අඩුම තරමේ ආණ්ඩුව විපක්ෂයට කතා කිරීමේ අවස්ථාවවත් ආණ්ඩුව දුන්නේ නෑ. සාමාන්‍යයෙන් රජයේ අයවැයක් යද්දි කාරක සභාව තමයි විපක්ෂයේ අවස්ථාව ලෙස සැලකෙන්නේ. වැට් එක ගෙනත් තිබෙන්නේ ආණ්ඩුව. ඒත් ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්වත් වැට් එක සම්බන්ධව ජනාධිපතිත් සමඟ එකඟත්වයක් නෑ කියලා අපි කියනවා. "

ලබන වසරේදී අධ්‍යාපනය දැඩි අර්බුදයකට

ගුරු විදුහල්පතිවරුන්ගේ ගැටලු විසඳීමට, පාසල් ගොඩනැගිලි ඉදිකිරීමට හා නඩත්තු කිරීමට අයවැයෙන් මුදල් වෙන් නොකිරීමෙන් ගැටලු රැසක්

- ලංකා ගුරු සංගමය

ඉන්දික කේවාවිතාරණ

ගුරු විදුහල්පතිවරුන්ගේ ගැටලු විසඳීමට, පාසල් ගොඩනැගිලි ඉදිකිරීමට හා නඩත්තු කිරීමට අයවැයෙන් මුදල් වෙන් නොකිරීම නිසා ලබන වසර තුළදී අධ්‍යාපනය දැඩි අර්බුදයකට ලක්වන බව ලංකා ගුරු සංගමය සඳහන් කරයි.

බොහෝ පාසල්වල ගොඩනැගිලි අබලන් තත්ත්වයේ පවතින බවත්, මේ නිසා ගොඩනැගිලි නඩත්තුවට හා අලුතින් ගොඩනැගිලි ඉදිකිරීමට අයවැයෙන් මුදල් වෙන් කරන ලෙසට අවස්ථා ගණනාවකදීම බලධාරීන්ගෙන් ඉල්ලා සිටි බවත් එම සංගමයේ ලේකම් ජෝසප් ස්ටාලින් මහතා සඳහන් කළේය.

මීට අමතරව පාසල් උපකරණ මිල අඩුකරන ලෙස හා ගුරු විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතා විසඳීම සඳහා මුදල් වෙන් කරන ලෙසටත් ඉල්ලීම් කර තිබූ බවත් ඒ කිසිදු කටයුත්තක් සඳහා මුදල් වෙන්කර නොමැති බවත් හෙතෙම පැවසීය.

ගුරු විදුහල්පති වැටුප් විෂමතා විසඳීමට හා පාසල් නඩත්තුවට මුදල් වෙන් නොකිරීම නිසා ලබන වසරේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු ආරම්භ වන්නේ දැඩි ගැටලුකාරී තත්ත්වයක් මත බවත්, මේ නිසා අදාළ ගැටලු විසඳගැනීමට අරගල සිදුකිරීමට ගුරු විදුහල්පතිවරුන්ට සිදුවන බවත් ලේකම්වරයා සඳහන් කළේය.

පවතින ආර්ථික අර්බුදය නිසා ගුරු විදුහල්පතිවරුන්ට විශාල ගැටලු ප්‍රමාණයක් නිර්මාණය වී තිබෙන බවත්, මේ නිසා වැටුප් විෂමතා විසඳීම යටතේ ලබා දීමට තිබෙන තුනෙන් දෙකේ කොටස ලබා ගැනීම සඳහා අඛණ්ඩ වෘත්තීය ක්‍රියා මාර්ග සිදුකිරීමට සැලසුම් කර තිබෙන බවත් හෙතෙම පැවසීය.

සෞඛ්‍ය ලේකම් පොරොන්දුවෙන් අකෂි රෝහලේ සත්‍යග්‍රහය පැයක් තුළ නවතී

ඉන්දික කේවාවිතාරණ

කොළඹ, ශ්‍රී ලංකා ජාතික අක්ෂි රෝහලේ ඊයේ(14දා) පැවැත් වූ සත්‍යග්‍රහය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා දුන් පොරොන්දු මත, පැයක පමණ කාලයකින් පසු නවතා දැමූ බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සඳහන් කරයි.

එම රෝහලේ පරිපාලන නිලධාරිනියගේ ක්‍රියා කලාපයට විරෝධය දක්වමින් ඊයේ උදෑසන 8.00 සිට සවස 4.00 දක්වා එක්දින සංකේත වැඩවර්ජනයක් සිදුකිරීමට සැලසුම් කර තිබූ බව එම සංගමයේ මාධ්‍ය කමිටු සාමාජික වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ මහතා සඳහන් කළේය.

අදාළ ගැටලු සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා බවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය පාලිත මහීපාල මහතා ඊයේ උදෑසන පොරොන්දු වූ බවත්, මේ අනුව එම රෝහලේ සිදුකළ වැඩ වර්ජනය ඒ මොහොතේම නවතා දැමූ බවත් හෙතෙම පැවසීය.

එම රෝහලේ පරිපාලන නිලධාරිනියගේ ක්‍රියා කලාපය නිසා සෞඛ්‍ය සේවකයන්ගේ කටයුතුවලට හා රෝගී සත්කාර සේවාවලට බලපෑම් සිදුවෙමින් තිබූ නිසා අදාළ වැඩ වර්ජනය සිදුකළ බව ප්‍රසාද් කොළඹගේ මහතා පැවසීය.

සාරවිට.lk
සාරෙට මත්වෙන්න
www.saaravita.lk

පාකිස්තානයේ ඉන්ධන මිල පහළට?

පාකිස්තානයේ ඩීසල් සහ පෙට්‍රල් මිල ගණන් ඊයේ (14දා) දිහයේදී පහත වැටීමක් සිදු වෙතැයි බලාපොරොත්තු වන බව එරට මාධ්‍ය සඳහන් කළේය. ඒ අනුව, පෙට්‍රල් සහ අධිවේගී ඩීසල් මිල ගණන් රු.10කින් පමණ පහත බසිනු ඇතැයි අදහස විය. විශේෂයෙන්ම, ලෝක වෙළෙඳ පොළෙහි ඉන්ධන මිල ගණන්හි සිදුවන පහත වැටීම් මේ සඳහා හේතුව ලෙස සැලකුණි.

සාම සාකච්ඡා සඳහා හමාස් නායකයාගෙන් කොන්දේසි

ඊශ්‍රායලය සමග පවතින ගැටුම් අවසන් කරමින් එකඟතාවක් වෙත පිවිසීම සඳහා තම සංවිධානය සූදානම් බව හමාස් සංවිධානයේ දේශපාලන අංශයේ ප්‍රධානියා වන ඉස්මායිල් හනියෙහ් පවසයි. පසුගියදා රූපවාහිනිය හරහා අදහස් දැක්වීමක් සිදු කරමින් ඔහු මේ බව සඳහන් කර තිබේ. ඒ අනුව, තමන් ඊශ්‍රායලය සමග සටන් විරාමයකට පිවිසෙන්නේ ස්වාධීන පලස්තීන රාජ්‍යයක් සඳහා වන එකඟතාවකට පිවිසෙන්නේ නම් පමණක් බවද ඔහු මෙහිදී අවධාරණය කර ඇත.

"ඊශ්‍රායලය සමග ඕනෑම ආකාරයක එකඟාවක් හෝ මුල පිරීමක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අපි විවෘතයි. මේ හරහා පලස්තීන ජනතාවගේ දේශපාලන ගමන් මාර්ගය සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වැදගත්." යනුවෙන් ඔහු මෙහිදී පවසා තිබේ. පලස්තීන රාජ්‍යයක් පිළිබඳ කාරණාව ප්‍රශ්නයක් නොවන බවට ඊශ්‍රායල අගමැති බෙන්ජමින් නෙතන්යාහු සිදුකළ ප්‍රකාශයට දිනකට පසුව හමාස් නායකයා මෙම අදහස් දැක්වීමත් විශේෂත්වයකි.

පසුගිය ඔක්තෝබර් 07 වැනිදා හමාස් සංවිධානය දකුණුදිග ඊශ්‍රායලය වෙත එල්ල කළ අනපේක්ෂිත ප්‍රහාරයත් සමග ආරම්භ වූ මෙම යුද්ධ ගැටුම් හේතුවෙන් මේ දක්වා ගාසා වැසියන් 18,000කට අධික පිරිසක් ජීවිතක්ෂයට පත්ව තවත් 30,000කට ආසන්න පිරිසක් තුවාල ලබා තිබේ.

ඇමෙරිකාවේ ටෙස්ලා රථ මිලියන 2ක් ආපසු කැඳවෙයි

එක්සත් ජනපදය තුළ අලෙවි කෙරුණු විදුලියෙන් ධාවනය කෙරෙන ටෙස්ලා මෝටර් රථ මිලියන 2ක් ආපසු කැඳවීමට එම සමාගම පසුගියදා තීරණය කර තිබේ. මෙම රථවල ඇති ස්වයංක්‍රීය ධාවන විශේෂාංගය සතු දෝෂ ඊට හේතුව වී තිබේ. ඒ අනුව, ඉදිරියේදී එම දෝෂය මඟහරවමින් අදාළ මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා මෙලෙස එම රථ ආපසු කැඳවීමක් සිදුකර තිබේ. එරට පාතික අධිවේගී මාර්ග ආරක්ෂක පාලනාධිකාරිය මගින් මෙම ටෙස්ලා මෝටර් රථ තුළ ඇති දෝෂ පිළිබඳව සිදුකළ පරීක්ෂණවල ප්‍රතිඵල ලෙස මෙය හඳුනාගෙන තිබේ.

ඉන්දීය පාර්ලිමේන්තුවට කඩාවැදීමේ සිදුවීමට හත් දෙනෙකුගේ වැඩ තහනම්

ඉන්දීය පාර්ලිමේන්තු සංකීර්ණයේ පහළ මන්ත්‍රී මණ්ඩලය වෙත පුද්ගලයන් දෙදෙනකු කඩාවැදීමේ සිදුවීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ හත් දෙනෙකුගේ වැඩතහනම් කර ඇතැයි වාර්තා වෙයි. විශේෂයෙන්ම, මෙම සිදුවීම පාර්ලිමේන්තුවේ මන්ත්‍රී මණ්ඩල දෙකෙහිම ආරක්ෂාවට එල්ලවූ දරුණු තර්ජනයක් බව විපක්ෂ දේශපාලන පක්ෂ චෝදනා කර සිටියි. මේ අතර, අදාළ සිදුවීම සම්බන්ධයෙන් ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි සිය පක්ෂයේ ඉහළ ඇමතිවරුන් කිහිප දෙනෙකු සමග ඊයේ (14දා) සාකච්ඡා කළ බවත් පැවසෙයි. පෙරේදා සිදුවී මෙම සිදුවීමේදී පාර්ලිමේන්තුවට කඩා වැදුණු දෙදෙනා ඊට දුම් ප්‍රහාරයක් එල්ල කර තිබේ.

පූටින් න්‍යෂ්ටික බලයෙන් යුත් නවතම සබ්මැරීන දෙකක් එළිදක්වයි

රුසියාව න්‍යෂ්ටික බලයෙන් යුත් නවතම සබ්මැරීන දෙකක් එළිදැක්වීමට පසුගියදා කටයුතු කළ බව පවසයි. ජනාධිපති ව්ලැදිමීර් පූටින්ගේ මූලිකත්වයෙන් මෙම අවස්ථාව සංවිධානය වී තිබේ. මෙහිදී අදහස් දක්වා ඇති පූටින් මෙවැනි සබ්මැරීන රුසියාව තවත් ආරක්ෂිත බවට හඟවන බව පවසා ඇත. මෙම සබ්මැරීන දෙක Krasnoyarsk සහ Emperor Alexander III ලෙස නම් කර තිබේ. මේ අතරින් Krasnoyarsk සබ්මැරීනය සතුව දිගු දුර මිසයිල නිතුත් කිරීමේ හැකියාව පවතී.

පාර්ලිමේන්තුවේදී හෘදයාබාදයක් වැලඳුණු තුර්කි මන්ත්‍රී මිය යයි



තුර්කි පාර්ලිමේන්තුවේදී පසුගියදා හෘදයාබාදයක් වැලඳී ඇදවැටුණු මන්ත්‍රී හසන් බිට්මෙස් ඊයේ (14දා) රෝහලේදී මිය ගිය බව වාර්තා වෙයි. 54 හැවිරිදි වියේ පසුවූ මන්ත්‍රීවරයා එරට විපක්ෂ සාධෙට් පක්ෂය නියෝජනය කළ අයෙකි. ඊශ්‍රායලය සම්බන්ධයෙන් වන තුර්කි රජයේ ප්‍රතිපත්තිය විවේචනය කරමින් පෙරේදා දිනයේදී ඔහු එරට පාර්ලිමේන්තුවේදී සිදුකළ අදහස් දැක්වීමෙන් අනතුරුව එක්වරම හෘදයාබාදයක් වැලඳී ඇද වැටුණි. අනතුරුව ඔහු රෝහල්ගත කෙරී තිබේ.

විජය
පරිගණක
ඔබේ රටේ වැඩීම පිරිසක් කියවන පරිගණක විද්‍යා මාසික සඟරාව
දෙසැම්බර් මාසයේ මුද්‍රිත සහ ඩිජිටල් සඟරා දැන් විකිණීමට තිබේ!

විජය පරිගණක මුද්‍රිත සඟරාවේ මිල රුපියල් 250 කි.
සෑම පුවත්පත් අලෙවි සැලකින්ම වය මිලදී ගත හැක.
විජය පරිගණක ඩිජිටල් සඟරාවේ මිල රුපියල් 200 කි.
පහත දැක්වෙන කිව්ආර් කෝඩ් එක ස්කෑන් කළ විට යොමු කෙරෙන වෙබ් අඩවියෙන් වය මිලදී ගත හැක.

wijeya newspapers
විජය නිදුකස්ලේස්ස් ලිමිටඩ සඟරාගමේ ප්‍රකාශනයකි.
දුරකතන අංක 0112 479 329 හෝ 0112 479 557 හෝ ඕනෑම අවස්ථා එකක් ඔස්සේ ඔබේ ඇණවුම් ලියාපදිංචි කළ හැක.



බලපිටිය, හරස්පොළ ඩීවර තොටුපොළේ තිබූ බෝට්ටු විස්සක් රළපහරකින් විනාශයි





● කරන්දෙණිය එම්.සුසිල් පියන්ත සහ ඇත්කඳුර ජනක ද සිල්වා

බලපිටිය, හරස්පොළ ඩීවර තොටුපොළට ඊයේ (14දා) උදැසන පැමිණි ඇති හදිසි රළපහරක් නිසා එම ඩීවර තොටුපොළේ ගාල් කර තිබූ මෝටර් බෝට්ටු විස්සක් පමණ මුළුමනින්ම විනාශවී තිබේ.

මෙවැනි රැල්ලක් සිය තොටුපොළට මින් පෙර කෙදිනක හෝ පැමිණ නොමැති බවත් මේ රැල්ලෙන් මෝටර් බෝට්ටු විනාශ වූ බවද ඩීවරයෝ පැවසූහ.

මේ හානියෙන් තමන්ට රුපියල් කෝටි ගණනක හානියක් සිදුව ඇති බවද ඔවුහු කියති.

කැස්බෑව පොලිසියේ OIC හා සෙසු නිලධාරීන් ලෙස පෙනී සිටි 3ක් අත්අඩංගුවට

● බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

කැස්බෑව පොලිසියේ ස්ථානාධිපති වරයා ඇතුළු නිලධාරීන් පිරිසක් ලෙස හඟවමින් පෙරේදා (13දා) රාත්‍රියේදී කැස්බෑව සර්වෝදය මාවතේ මාර්ග බාධකයක් යොදා මහමග ගමන්ගත් පුද්ගලයන් පරීක්ෂා කිරීමේ යෙදී සිටි පුද්ගලයන් තිදෙනෙක් අත්අඩංගුවට ගත් බව කැස්බෑව පොලිසිය සඳහන් කරයි.

ජබුරලිය සහ නිවුන්ගම පදිංචි වයස 35 - 45 අතර තිදෙනෙක් මෙසේ අත්අඩංගුවට පත්ව සිටිති.

එම සැකකරුවන් පැමිණා තිබූ යතුරුපැදි දෙකක්ද පොලිස් භාරයට ගෙන ඇත.

ත්‍රිරෝද රථයකින් රාත්‍රී ජංගම සංචාරයේ නිරත පොලිස් නිලධාරීන් දෙදෙනෙකු මඩපාත සර්වෝදය මාවතේ කෙළවරට වන්නට පිරිසක් රැඳී සිටින අයුරු දැක එම ස්ථානයට ත්‍රිරෝද රථයෙන් ළඟා වීමත් සමගම එහි සිටි පුද්ගලයන් තිදෙනෙක් පළා යන්නට වූ බව පොලීසිය කියයි.

වහා ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන් පලායමින් සිටි පිරිස පසුපස හඹා ගොස් දෙදෙනෙක් ඒ මොහොතේම අත්අඩංගුවට ගැනීමට සමත් වී ඇත.

අනතුරුව ඔවුන් දෙදෙනාට අත්මාංචු දමා ඔවුන් සිටි තැනට රැගෙන ඒමෙන් අනතුරුව එහි සිටි පුද්ගලයන් දෙදෙනාගෙන් අනාවරණය වී ඇත්තේ තමන් පෙදරේරු රැකියාවේ නිරත වන බවත් මදුරු කොයිල් මිලදී ගැනීම සඳහා වෙළඳ සැලට යමින් සිටියදී තිදෙනාගෙන් අයෙකු තමන් කැස්බෑව පොලිසියේ ඕ අයි සි බවත් නවතින ලෙසත් පැවසූ බව යයි පොලිසිය කියයි.

එම විධානයට අනුව තමන් නැවතුණු බවත් ඕ අයි සි යනුවෙන් හැඳින්වූ පුද්ගලයා අනෙක් පුද්ගලයා අමතා " පීසී මේ දෙන්න ගේ අයිඩෙන්ටි චෙක් කරනවා" යැයි පැවසූ පසු ඔහු තමන්ගෙන් හැඳුනුම්පත් ඉල්ලා සිටි බවත්ය.

තමන් වෙළෙඳ සැලට යන බැවින් හැඳුනුම්පත් ගෙනාවේ නැති බව පැවසීමෙන් අනතුරුව ඒ බව පී.සි යනුවෙන් හැඳින්වූ පුද්ගලයා ඕ අයි සි යනුවෙන් හැඳින්වූ පුද්ගලයාට පැවසීමෙන් අනතුරුව" සාජන් මේ දෙන්නව හොඳට චෙක් කරනවා" යයි ඕඅයිසි හඳුන්වා ගත් පුද්ගලයා පවසා ඇතැයි පොලිසිය කියයි.

අත්අඩංගුවට ගත් සැකකරුවන් පොලීසියට රැගෙන ඒමෙන් අනතුරුව සිදුකළ දීර්ඝ ප්‍රශ්න කිරීමේදී කැස්බෑව පොලීසියේ ඕ.අයිසි ලෙස රඟපෑ සැකකරු අරක්කැමියෙකු ලෙස සේවය කරන අයෙකු බවත් සැරයන් ලෙස හැඳින්වූ සැකකරු ත්‍රිරෝද රථ රියැදුරකු බවත්, පී සී ලෙස හැඳින්වූ සැකකරු රැකියාවක් නොමැති අයෙකු බවට අනාවරණය වූ බවත් පොලිසිය කියයි.

කැස්බෑව පොලිසිය සිද්ධිය පිළිබඳ වඩිදුර පරීක්ෂණ සිදු කරයි.

15 හැවිරිදි සිසුවෙකුට පහරදී අඩන්තේට්ටම් කළ හිටපු විදුහල්පතිනියට රු.ලක්ෂ 10ක දඩයක්

- සිසුවා නිර්මාණය කළ පොසොන් කූඩුවට හිමි ත්‍යාගය තමන්ට නුදුන්නැයි එවක විදුහල්පති පාසලේදී සිසුවාට අමානුෂිකව පහරදීලා

● කළුතර සුනිල් එස් .තන්ත්‍රිආරච්චි

15 හැවිරිදි බාලවයස්කාර සිසුවෙකුගේ භාරකාරත්වය හෝ ආරක්ෂාව දරා සිටිමින් එම දරුවාට වේවැලකින් පහරදීම, අඩන්තේට්ටම් කිරීම, හිංසා කිරීම හා නොසළකා හැරීම යන චෝදනාවලට වරද පිළිගත් විදුහල්පතිනියකට කළුතර මහාධිකරණ විනිසුරු ප්‍රදීප් එන්.අබේරත්න මහතා රුපියල් ලක්ෂ 10ක වන්දි මුදලක් එම දරුවාට ගෙවන ලෙස නියම කළේය.

දොඩන්ගොඩ නවෝද්‍යා පාසලේ හිටපු විදුහල්පතිනිය වූ සරෝජිනී නිර්මලා කොතලාවල නමැත්තියකට මෙසේ දඩ නියම කෙරිණි.

ඊට අමතරව රජයේ ගාස්තු වශයෙන් රුපියල් 1500/ ක් ගෙවන ලෙසත්, නියම කළ විනිසුරුවරයා එම මුදල නොගෙවන්නේ නම් මාස තුනක සුළු වැඩ සහිත සිර දඬුවමක්ද, වන්දි මුදල නොගෙවන්නේ නම් මාස 24 ක බරපතළ වැඩ සහිත සිර දඬුවමක්ද නියම කළේය.

2013 ජූනි මස 26 හෝ ඊට ආසන්න දිනයකදී දොඩන්ගොඩදී එවකට බාල වයස්කාර දරුවෙකු වූ තොටවත්ත බණ්ඩාරගේ ඉෂාර ජගත් නම්වූ සිසුවා කෲරත්වයට පත් කරන ලදැයි කියමින් නීතිපතිවරයා විසින් ඇයට එරෙහිව චෝදනා ගොනු කර තිබිණි.

දොඩන්ගොඩ පොලීසිය මගින් එම වසරේ පොසොන් උත්සවය නිමිනිකොට තුඩුගල හංදියේ පහන් කූඩු තරගයක් හා ප්‍රදර්ශනයක් පවත්වා ඇති බවත්, දොඩන්ගොඩ නවෝද්‍යා විද්‍යාලය නියෝජනය කරමින් මෙම සිසුවා ඉදිරිපත් කළ බෝතලයක් තුළ කැරකෙන පහන් කූඩුවට ප්‍රථම ස්ථානය හිමිවී ඇති බවත් නඩු විභාගයේදී අණාවරණය විය.

එම වේදිකාවේදී සිසුවා මුදල් චෙක්පත හා සහතික පත්‍රය ලබා ගත් පසු එය විදුහල නියෝජනය කරමින් ඉදිරිපත් කළ නිර්මාණයක් කියමින් විදුහල්පතිනිය තෑගි එම ස්ථානයේදීම ලබාගෙන තිබිණි.

ඉන්පසු ඇය තමාට එම ජයග්‍රාහී තිළිණ ලබා ගැනීමට ඉඩ නුදුන් බව පවසමින් පාසැලේදී ප්‍රසිද්ධියේ පහරදී ඇති බවත්, සෙසු ගුරු මහත්ම මහත්මීන් පවා නොසලකා හැර ඇති බවත් ,තමා කැමැත්තෙන් සිටි තාක්ෂණවේදය විෂය ධාරාවෙන් උසස් පෙළට ඉදිරිපත් වීමට ඔහුට නොහැකිවූ බවත් නඩු විභාගයේදී අනාවරණය විය.

මෙය දඩ හා සිර දඬුවම් නියම කළ හැකි වරදක් වුවද , චූදිත විදුහල්පතිනිය 2018 වසරේ කළුතර අධ්‍යාපන කලාපයේ හොඳම විදුහල්පතිනිය වීම 2016 හා 2017 වසරවලදී සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ඉහළ නංවා ගැනීමට දායකවීම හා වසර 29ක සේවා කාලය තුළදී සිදු කර ඇති වැඩදායක කරුණු හා මින් ඉදිරියට මෙවන් වැරදි සිදු නොකරන බවටවූ පොරොන්දුව සළකා බලා ඇයට ලිහිල් දඬුවමක් නියම කරන බව විනිසුරුවරයා සඳහන් කළේය.

අනතුරුව විදුහල්පතිනිය ඊයේ (14දා) විනිසුරුවරිය ඉදිරියේ එම මුදල ගෙවා දැමුවාය.

රජයේ අධිනීතිඥ මල්ෂා මඩවලගම මහත්මිය මෙහිදී පැමිණිල්ල මෙහෙයවූ අතර නීතිඥ කනිෂ්ක වන්නිආච්චි මහතා විත්තිකාරිය වෙනුවෙන් පෙනී සිටියේය.

බණ්ඩාරගම ප්‍රා. සභාවේ පැවති දූෂණ වංචා මැඩලූ ලේකම්වරියට ස්ථාන මාරු ලබාදීමේ උත්සාහයට විරෝධය

● බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය ස්ථාන මාරු කිරීමේ සූදානමට විරෝධය පළ කරමින් සංවිධාන කළ විරෝධතාවක් ඊයේ (14දා) බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව ඉදිරිපිටදී පැවැත්විණි.

මහා සංඝරත්නය, ප්‍රාදේශීය සභාවේ සේවක සේවිකාවන් සහ ප්‍රාදේශවාසීන් එක්ව මෙය සංවිධාන කොට තිබිණි.



ප්‍රාදේශීය සභාවේ පැවති දූෂණ වංචා අක්‍රමිතා, දුරුකරමින් ජනතා මුදල් ආරක්ෂා කර ඵලදායී සංවර්ධන වැඩ සඳහා යෙදවීම පමණක් කළ ලේකම්වරිය වන බී.ඒ.ඩී.ඒ.ගයන්ති මහත්මිය අසාධාරණ ලෙස ස්ථාන මාරු කිරීම දූෂණ වංචාවල යෙදෙන කිහිපදෙනෙකුගේ උවමනාවට කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන ප්‍රබල දේශපාලනඥයෙකු විසින් සිදු කරන අසාධාරණ ක්‍රියාවක් බව විරෝධතාව අතුරතුර අදහස් දැක්වූ අයෙක් පවසා සිටියහ.

මෙම නිහඬ විරෝධතාවට පක්ෂ භේදයකින් තොරව මහජන නියෝජිතයන් සහභාගි වීම විශේෂත්වයකි

විවිධ විරෝධතා වැකි සඳහන් පුවරු ප්‍රදර්ශනය කරමින් පැයකට ආසන්න කාලයක් පිරිස විරෝධයේ යෙදුණහ.

කළුතර දිස්ත්‍රික් පරිවේණාධිපති හා කෘත්‍යාධිකාරී සංගමයේ ලේකම් රොටුබ පේමරතන, ජාතික ජන බලවේගයේ නිටපු මන්ත්‍රී සමිත් ජයගේ ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

මීරිගම රේසින් ධාවන පථයෙහි තරග පවත්වන්නැයි කළ ඉල්ලීම ප්‍රතික්ෂේප වෙයි

● වාරණ ආනන්ද ඉ ජයකොඩි.

මහජන පීඩාවක් සිදුවන බවට නිරීක්ෂණය කර ස්ථිරව තහනම් කර ඇති මීරිගම හකුරු කුඹුර රේසින් ධාවන පථයෙහි නැවත මධ්‍යම පරිසර අධිකාරියේ විශේෂඥ නිලධාරීන් කැඳවා ඔවුන් ගේ අධීක්ෂණය යටතේ තරග පවත්වා ඒ පිළිබඳ වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කිරීමට අවසර ලබා දෙන ලෙසට නීතීඥ ගාමිණී විජේතිලක මහතා මෝසමක් මගින් එම නඩුව කැඳවා කරන ලද ඉල්ලීමක් අත්තනගල්ල අංක 02 මහේස්ත්‍රාත් මංජුල කරුණාරත්න මහතා ඊයේ (14දා) ප්‍රතික්ෂේප කළේය.

මීරිගම ප්‍රාදේශීය සභාවේ අවසරයකින් තොරව නීති විරෝධීව කොසිබා නමැති සමාගමක් විසින් මීරිගම හකුරු කුඹුර ගම්මානයේ පවත්වා ගෙන ගිය මෝටර් රථ හා යතුරුපැදි රේසින් ධාවන පථයෙන් මහජන පීඩාවක් සිදුවන බවට නීරණය කර පසුගිය ජූනි මස (01දා) අධිකරණය විසින් ස්ථිරව තහනම් කර ඇත.

නීතීඥ ගාමිණී විජේතිලක මහතා ඊයේ (14) පස්වරුවේ එම නඩුව මෝසමක් මගින් කැඳවා මධ්‍යම පරිසර අධිකාරියේ විශේෂඥ නිලධාරීන් කැඳවා අදාළ තරග පවත්වා ස්ථිර වශයෙන්ම මහජන පීඩාවක් සිදුවන්නේ ද යන්න පරීක්ෂණයක් පවත්වා අධිකරණයට කරුණු වාර්තා කිරීමට අවසර ලබා දෙන ලෙසට ඉල්ලා සිටියේය.

පසුගිය නොවැම්බර් මස (04දා) අධිකරණයේ අවසරය පරිදි කාර්මික නාක්ෂණ ආයතනයේ අධීක්ෂණය යටතේ මෝටර් රථ හා යතුරුපැදි පරීක්ෂණ තරග පැවැත්වූ බවද නීතීඥ වරයා කීය.

මෙනිදී මහේස්ත්‍රාත්වරයා කරුණු දක්වමින් පෙර දිනයක අධිකරණයේ නියෝග පරිදි මධ්‍යම පරිසර අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික් ප්‍රධාන නිලධාරියෙකු වන හික්කඩුව ලියනගේ සමන් ප්‍රියන්ත මහතා අධිකරණයට පැමිණ සාක්කි කුඩුවට නැඟ දිව්රා රේසින් ධාවන පථ පරීක්ෂා කිරීමට මධ්‍යම පරිසර අධිකාරියට බලයක් නැති බව කියා ප්‍රකාශ කර ඇති බවකියා සිටියේය.

එදා රේසින් ධාවන පථ පරීක්ෂා කිරීමට බලයක් නැහැ කියූ මධ්‍යම පරිසර අධිකාරියට දැන් බලය ලැබුණේ කෙසේද යන්නත් මහේස්ත්‍රාත්වරයා විවෘත අධිකරණය ඉදිරියේ වැඩිදුරටත් කරුණු දක්වමින් විමසා සිටියේය.

කළුතර යතුරුපැදි සොරාගත් අයෙක් අත්අඩංගුවට

● පානදුර - සුමිත් පොතුපිටිය

කළුතර දකුණ දුම්රිය ස්ථානය අසල නවතා තබන යතුරුපැදි සූක්ෂ්ම ලෙස කලක පටන් සොරකම් කළ පුද්ගලයෙකු අත්අඩංගුවට ගත් බව කළුතර කොට්ඨාස විෂ මත්ද්‍රව්‍ය වැටලීම් ඒකකය පවසයි.

පයාගල මල්ලෙගොඩ ප්‍රදේශයේ පදිංචි 24 හැවිරිදි පුද්ගලයෙකු මෙසේ අත්අඩංගුවට පත්ව ඇත.

මොහු විසින් සොරකම් කළ බවට සැකකරන යතුරුපැදි හතරක්ද පොලිස් භාරයට ගනු ලැබ තිබේ. මොහු යතුරුපැදි අලුත්වැඩියා කරන්නෙකු බවද පොලිසිය කීය.

ලද තොරතුරක් මත පයාගල ,මැටියලමුල්ල ප්‍රදේශයේ දී, සොරකම් කළ යතුරුපැදියකින්ම ගමන් කරමින් සිටියදී අත්අඩංගුවට ගෙන කළ ප්‍රශ්න කිරීමෙන් පසු සොරකම් කළ තවත් යතුරුපැදි තුනක් සොයාගත් බව පොලීසිය කීය.

කළුතර කොට්ඨාස අපරාධ ඒකකය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

'සුභාවිත වියමන' හෙට ගම්පහදී

යක්කල - අඹගහලන්ද වත්ත සුබසාධක සමිතිය සංවිධානය කරන සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් පැවැත්වෙන 'සුභාවිත වියමන' සංගීත ප්‍රසංගය හෙට 16 වැනිදා ප.ව 6.30 ට ගම්පහ බණ්ඩාරනායක විදුහල් රංග ශාලාවේදී පැවැත්වීමට නියමිතය.

බන්දුල විජේවීර, පුණ්‍යා කන්‍රිආරච්චි, චන්ද්‍රකුමාර් කඳනාරච්චි, දයාරත්න පෙරේරා, රෝහණ බෝගොඩ, රෝහණ සිරිවර්ධන, නිර්මලා රණතුංග හා ඉල්ලියාස් බෙග් මෙහි ගායනයෙන් දායක වෙති. සංගීතය ප්‍රියන්ත නිශ්ශංක ප්‍රමුඛ රාජ්‍ය වාද්‍ය වෘන්දය විසින් මෙහෙයවන අතර කථනය ඉන්ද්‍රසිරි සුරවීරගෙනි.

පාසල් සිසුවියක හා සිසුවෙකු ලෙස අසභ්‍ය වීඩියෝ පට රූගත කරමින් සිටියදී අත්අඩංගුවට ගත් සරසවි සිසු යුවළට ඇප

- අදාළ යුවළගේ අසභ්‍ය වීඩියෝ ලක්ෂ 80කට අධික පිරිසක් නරඹලා

● ෂේන් සෙනෙවිරත්න

පාසල් සිසුවියක හා පාසල් සිසුවෙකු ලෙස පෙනී සිටිමින් අසභ්‍ය වීඩියෝ පට නිෂ්පාදනය කොට අන්තර්ජාලයට මුදා හැරීමට අසභ්‍ය වීඩියෝ පටයක් නිෂ්පාදනය කරමින් සිටි විශ්වවිද්‍යාල සිසුවියක සහ පෞද්ගලික විශ්වවිද්‍යාලයක සිසුවෙකු අත්අඩංගුවට ගත් බව කඩුගන්නාව පොලීසිය සඳහන් කරයි.

28, 29 හැවිරිදි දෙදෙනෙක් මෙසේ අත්අඩංගුවට ගෙන ඇති බවත්, නීත්‍යානුකූලව විවාහ ගිවිසගෙන සිටින ඔවුන් ඉදිරි කාලයේ ඔවුන්ගේ විවාහ මංගල උත්සවය ගැනීමට අපේක්ෂාවෙන් සිටින බවත් පොලිස් විමර්ශනවලදී අනාවරණය වී තිබේ.

අත්අඩංගුවට ගත් කාන්තාව රුවන්වැල්ල ප්‍රදේශයේ පදිංචිකාරිනියක වන අතර තරුණයා පිළිමතලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙක් බව පොලීසිය කියයි.

කඩුගන්නාව ප්‍රදේශයේ ලැගුම්හලක අසභ්‍ය වීඩියෝ පටයක් රූගත කරන බවට කඩුගන්නාව පොලීසියට ලද තොරතුරකට අනුව එම ලැගුම්හල වටලා සැකකාර යුවළ අත්අඩංගුවට ගනු ලැබ ඇත.

අදාළ යුවල පරීක්ෂා කිරීමේදී ජංගම දුරකථන කිහිපයක්, ලැප්ටොප් පරිගණකයක් සහ ජංගම දුරකථන රඳවනයක්ද විවිධ පාසල්වල පාසල් නිල ඇඳුම් කිහිපයක්ද අත්අඩංගුවට ගැනීමට පොලීසියට හැකිව තිබේ. ඔවුන්ගෙන් සිදුකළ වැඩිදුර ප්‍රශ්න කිරීම්වලදී මුදල් සොයා ගැනීමට පාසල් සිසුන් ලෙස සැරසී අසභ්‍ය වීඩියෝ පට නිෂ්පාදනය කොට අන්තර්ජාලයට මුදාහරින බව විමර්ශන නිලධාරීන්ට පවසා තිබේ.

ඔවුන් එම අසභ්‍ය වීඩියෝ පට මුදාහළ වෙබ් පිටු කිහිපයක්ද පොලීසියේ නිරීක්ෂණයට ලක් වී ඇති අතර එම වෙබ් පිටු ලක්ෂ අසූවකට අධික පිරිසක් නරඹා ඇති බවද නිරීක්ෂණය වී තිබේ.

සැකකරුවන් දෙදෙනා මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු දැඩි ඇප කොන්දේසි මත මුදා හැර තිබේ.

මහාචාර්ය සංඝ සුමන නාහිමිගෙන් ප්‍රජා සත්කාරයක්

● අලුත්ගම තුසිත කුමාර ද සිල්වා

බේරුවල මංගලාරාම මහා විහාරාධිපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ අධ්‍යක්ෂ, භූගෝල විද්‍යාව පිළිබඳ මහාචාර්ය පින්නවල සංඝ සුමන නාහිමියන් වසරක් පුරා සිදු කරන ප්‍රජා සත්කාරක වැඩසටහනක් පසුගියදා එම විහාරස්ථ ධර්ම මන්දිරයේදී සිදු කෙරෙණි.

ඒ අනුව අඩු ආදායමිලාභී ගර්භනී මව්වරුන් වෙනුවෙන් උපකරණ හා පෝෂණ මලු පරිත්‍යාග කර විහාරස්ථ දහම් පාසලේ ඉගෙනුම ලබන පන වසර ශිෂ්‍යත්වය සමත් දරුවන්ටද පාසල් බෑග් හා අධ්‍යාපන උපකරණ කට්ටල ප්‍රදානය කරන ලදී.

මේ අතර දහම් පාසලේ අධ්‍යාපනය ලබන අඩුආදායම් ලාභී පවුල්වල දරුවන්ට පාසල් උපකරණ පිරිනැමීම සිදු කළ අතර බේරුවල රජයේ රෝහලටද උපකරණ පිරි නැමීමක් මෙහිදී සිදු කළහ.



කඩොලාන පරිසර පද්ධති පිළිබඳ අවධානය යොමු කරමින් SLT-MOBITEL 2024 දින දර්ශනය එළිදක්වයි

ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම් සම්පාදක වන SLT-MOBITEL, ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසර පද්ධති' යන තේමාව යටතේ තම 2024 දින දර්ශනය පසුගියදා එළිදැක්වී ය. මෙමගින් රටේ ස්වභාවික උරුමයක්වන කඩොලාන පරිසර පද්ධතිවල සුන්දරත්වය හා ඒවා ආරක්ෂා කරගැනීමේ වැදගත්කම අවධාරණය කෙරේ.

ලොව පුරාම කඩොලාන පද්ධති මේ වනවිට විනාශ වී යාමේ තර්ජනයට මුහුණා දී ඇත. මෙවැනි තත්ත්වයක් යටතේ SLT-MOBITEL හි 2024 දින දර්ශනය, පෙව් විවිධත්වය සුරැකීම සහ දේශගුණ විපර්යාසවල බලපෑම් අවම කිරීම සඳහා කඩොලාන පරිසර පද්ධති මගින් ඉටුවන මෙහෙවර පිළිබඳව ජනතාව දැනුවත් කිරීම තුළින් ඒවා සංරක්ෂණය කිරීමේ වැදගත්කම පෙන්වා දෙයි.



මෙම දින දර්ශනයට ශ්‍රී ලංකාවේ කඩොලාන පරිසරයන්හි එකිනෙකට වෙනස් වූ අංග නිරූපණයකරන අලංකාර චිත්‍ර 13ක් ඇතුළත් වී තිබේ. පුලස්ති එදිරිවීර, පාරමී විද්‍යාරත්න සහ පියුමි මගේෂිකා යන චිත්‍ර ශිල්පීන් විසින් කඩොලාන පරිසර පද්ධතිවල සුන්දරත්වය සහ විවිධත්වය තම සිතුවම් තුළින් මැනැවින් නිරූපණය කර ඇත.

ශ්‍රී ලංකාවේ ජාතික කඩොලාන විශේෂඥ කමිටුවේ සභාපති සහ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ධීවර හා ජලජ ජීවී අධ්‍යයන පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සෙව්වන්දි ජයකොඩි මහත්මියගේ සම්පත් දායකත්වය යටතේ මෙම දින දර්ශනය සකස් කර තිබේ.

මෙරට වෙරළ තීරයේ හෙක්ටයාර 19,000 ක් පමණ කඩොලාන සහ ඒ ආශ්‍රිත අනෙකුත් ශාක වර්ග මගින් ආවරණය වී තිබේ.

මලල ක්‍රීඩිකා තරුෂිගේ ප්‍රතිකාරවලට අයර්ලන්තයට යාම ක්‍රීඩා ඇමති වළක්වයි



ඉන්දියාවේ, සිංගප්පූරුවේ හා ඔස්ට්‍රේලියාවේ රෝහල් තිබෙද්දී ක්‍රීඩා වෛද්‍ය ආයතනයෙන් අයර්ලන්තයටම යවන්න හදලා

අපෙන් කිසිම ඉල්ලීමක් කළේ නෑ - මලල ක්‍රීඩා සම්මේලනය

ආබාධවලට නිසි ප්‍රතිකාර නොලැබුණොත් දීර්ඝකාලීනව ගැටලු එන්න පුළුවන් - ක්‍රීඩා වෛද්‍ය ආයතනය

ඕෂින වරකපිටිය

ආසියානු මලල ක්‍රීඩා උළෙලේ රන් පදක්කම්ලාභී ධාවන ශූරී තරුෂි කරුණාරත්න වෛද්‍ය ප්‍රතිකාර සඳහා අයර්ලන්තයට යාම සඳහා ක්‍රීඩා වෛද්‍ය ආයතනය විසින් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් කළ ඉල්ලීම ක්‍රීඩා අමාත්‍ය හරින් ප්‍රනාන්දු මහතා ප්‍රතික්ෂේප කර තිබේ.

ක්‍රීඩා වෛද්‍ය ආයතනය, ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුව, ජාතික මලල ක්‍රීඩා සංගමය, ජාතික තේරීම් කමිටුව හා ජාතික ක්‍රීඩා සභාවේ නියෝජිතයන් සමග අමාත්‍යාංශ කාර්යාලයේදී පැවති හමුවකදී මෙම තීරණය ගෙන ඇත. එහිදී අයර්ලන්තයේදී තරුෂිගේ වෛද්‍ය ප්‍රතිකාර හා අනෙකුත් වියදම් සඳහා කළ ඉල්ලීම මෙහිදී ප්‍රතික්ෂේප කරමින් අමාත්‍යවරයා පවසා ඇත්තේ, වෛද්‍ය කමිටුවක් පත් කර තරුෂිගේ ආබාධය පිළිබඳ තවදුරටත් සොයා බලන ලෙසයි.

මෙහිදී තරුෂි කරුණාරත්න හා ඇගේ සොයුරා සමගින් වෛද්‍යවරයෙකු අයර්ලන්තයට යාම සඳහා කළ ඉල්ලීම ඉටුකිරීමට විශාල මුදලක් වැය වීම, ඇයගේ ආබාධය පිළිබඳ ජාතික මලල ක්‍රීඩා සම්මේලනයට හෝ ශ්‍රී ලංකා ඔලිම්පික් කමිටුවට දැනුම්දී නොතිබීම, ඉන්දියාවේ හෝ සිංගප්පූරුවේ සුප්‍රසිද්ධ රෝහල් රැසක ප්‍රතිකාර සඳහා සාපේක්ෂව අඩු මුදලක් වැය වෙද්දී ඒවා නොතකමින් ඇයව අයර්ලන්තය වෙතම යැවීමට ක්‍රීඩා වෛද්‍ය ආයතනය ඉල්ලීමක් කර තිබීම ගැටලුකාරී බව අමාත්‍යවරයා මෙහිදී පෙන්වාදී ඇති බවද වාර්තා වේ.

මෙහිදී තරුෂි එළඹෙන ජනවාරි 04වැනිදා අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනීසිටීමට නියමිත අපේක්ෂිකාවක් වීමද අවධානයට යොමු වී ඇත.

මේ සම්බන්ධයෙන් අප ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සම්මේලනයේ ප්‍රධාන ලේකම් සමන් කුමාර මහතාගෙන් කළ විමසීමකදී ඒ මහතා පැවසුවේ, තරුෂිගේ ආබාධයට ප්‍රතිකාර ගැනීම සඳහා අයර්ලන්තයට යාම පිළිබඳ සිය සම්මේලනයට කිසිදු ඉල්ලීමක් නොලැබුණු බවයි. මෙවැනි වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම්වලදී සිය සම්මේලනය මුලින්ම දැනුවත් කිරීමක් සිදුකළ යුතු වුවද තමන්ට ක්‍රීඩා වෛද්‍ය ආයතනය හරහා කිසිදු දැනුම්දීමක් සිදු නොකළ බව හෙතෙම පැවසීය.

මේ අතර මෙම සිදුවීම සම්බන්ධයෙන් ක්‍රීඩා වෛද්‍ය ඒකකයේ උසස් නිලධාරියෙකුගෙන්ද අප විමසීමක් කළෙමු. එහිදී ඔහු ප්‍රකාශ කළේ, තරුෂි වැනි විශේෂිත ක්‍රීඩිකාවකගේ ආබාධයක් දීර්ඝ කාලීනව සුව කිරීමට ඒ පිළිබඳ විශේෂිත ප්‍රතිකාර ඒකකයකට යොමුකිරීමේ අරමුණින් මෙම පියවර ගත් බවයි.

"තරුෂිගේ දැනට ඇති වෙලා තියෙන ආබාධය නිසි හඳුනාගැනීමක් හා නිසි ප්‍රතිකාර නොලැබුණොත් දීර්ඝකාලීනව ගැටලු එන්න පුළුවන්. ඒක හඳුනාගැනීම හා ප්‍රතිකාර කිරීමේ විශේෂිත මධ්‍යස්ථාන ලෝකයේ තිබෙන්නේ කුඩා ප්‍රමාණයක්. සිංගප්පූරුවෙත් මේ සඳහා සෑම පහසුකමක්ම නෑ. යුරෝපයේ හා ඔස්ට්‍රේලියාවේ මේ වගේ මධ්‍යස්ථාන තිබෙනවා. ඒ අතරින් අයර්ලන්තය තෝරාගන්න එක හේතුවක් වුණේ අපේ ශ්‍රී ලංකාවේ ක්‍රීඩිකයන් රාශිකයට ප්‍රතිකාර කරපු ශ්‍රී ලාංකික භෞත චිකිත්සකවරයෙකු වූ තිලිණ විතාරණ මහත්මය දැන් ඉන්නේ, අයර්ලන්තයේ නිසා. ඇත්තටම තරුෂි වගේ ක්‍රීඩිකාවකට විශේෂිත පහසුකම් දීලා රැකගත යුතුයි. අපේ හිටපු ඔලිම්පික් මට්ටමේ ක්‍රීඩිකයොත් ආබාධවලට නිසි ප්‍රතිකාර නොලැබිලා, දීර්ඝ කාලීනවය ඒවා හොඳ කරගන්න බැරි වුණ අවස්ථා තිබුණා. අපි මෙවැනි ඉල්ලීමක් කළේ ඒ නිසා" යැයි පැවසීය.

එමෙන්ම මේ සඳහා එම්.ආර්.අයි. පරීක්ෂණ සිදුකළ බවත්, තරුෂිගේ තත්ත්වය සොයාබැලීම සඳහා වෛද්‍ය කමිටුවක් මගින් පරීක්ෂණ මේ වනවිට සිදුකරන බවත් අදාළ නිලධාරියා වැඩිදුරටත් පැවසීය.

එසේම 19 හැවිරිදි තරුෂි, පසුගියදා නිමා වූ ආසියානු මලල ක්‍රීඩා උළෙලේදී වසර 21කට පසු ශ්‍රී ලංකාවට රන් පදක්කමක් හිමි කරදීමට සමත් වූවාය. ඒ කාන්තා මීටර් 800 ධාවන ඉසව්වේනි. එහිදී ඇය නව ශ්‍රී ලංකා වාර්තාවක්ද පිහිටුවීමට සමත් වූවාය.

71වැනි ජාතික බැඩ්මින්ටන් ශූරතාවලිය (බැඩ්මින්ටන් වයස 17න් පහළ කාණ්ඩය)

ශූරතාව

පිරිමි - රෙෂාන් හරිත් කාන්තා - දිලිනි අම්බලන්ගොඩගේ

ශ්‍රී ලංකා බැඩ්මින්ටන් ආයතනය විසින් සංවිධානය කළ 71වැනි ජාතික බැඩ්මින්ටන් ශූරතාවලියේ අවුරුදු 17න් පහළ බාලක ශූරතාව දිනාගැනීමට රෙෂාන් හරිත් සමත් වූ අතර, දිලිනි අම්බලන්ගොඩගේ විසින් එහි බාලිකා ශූරතාව දිනාගත්තාය.

මෙහි පිරිමි අවසන් තරගයේදී රෙෂාන් හරිත් විසින් හිරුක සහන්මිත් තරග වට 2-1කින් පරාජය කළ අතර, බාලිකා අවසන් තරගයේදී තරග වට 2-0කින් රනුමි මානගේ පරාජය කිරීමට දිලිනි අම්බලන්ගොඩගේ සමත් වූවාය.

මේ අතර ඊතිර අබේගුණවර්ධන සහ තෙනුල් රසාංජන තරග වට 2-1කින් පරාජය කර එම වයස් කාණ්ඩයේ බාලක යුගල තරග අංශය දිනාගැනීමට සනුද ආරියසිංහ සහ තිසත් රන්තුක සමත් වූ අතර, තරග වට 2-0කින් තිසේජා හේරත් සහ රනුමි සුභාසිනි පරාජය කරමින් දිලිනි අම්බලන්ගොඩගේ සහ සඳුනි දෙව්මිණි එහි බාලිකා යුගල ශූරතාව ජය ගත්හ.

අවුරුදු 15න් පහළ බාලක ශූරතාව සෙනුත් සෙත්මිත ජය ගත් අතර, එහි අවසන් තරගයේදී තරග වට 2-0කින් කෙනෙත් අරුක්ගොඩ පරාජය විය. මෙම වයස් කාණ්ඩයේ යුගල ශූරතාව තරග වට 2-0කින් බුද්ධි ශෙනාල් සහ දිනෙව් විමලරත්න පරාජය කරමින් කෙනෙත් අරුක්ගොඩ සහ සෙනුත් සෙත්මිත විසින් ජය ගත්හ. නෙත්මි අමායා සමග තරග වැදුණු විශ්වනී වන්නිආරච්චි තරග 2-0ක ජයග්‍රහණයක් වාර්තා කර අවුරුදු 15න් පහළ බාලිකා ඒකල තරග අංශය ජය ගත් අතර, එම වයස් කාණ්ඩයේ බාලිකා ශූරතාව තරග වට 2-1කින් සඳරුවි ජයලත් සහ රශ්මිදි උමගලිය පරාජය කළ ඉසුරි භාග්‍යා අත්තනායක සහ සිතුමි මිනාරා ද සිල්වා දිනාගත්හ.

මෙහි අවුරුදු 13න් පහළ බාලක ඒකල ශූරතාව තරග වට 2-0කින් යස්මිත් ගනේපොල පරාජය කළ තමිඳු ප්‍රනාන්දුට හිමි වූ අතර, එම වයස් කාණ්ඩයේ බාලිකා ශූරතාව තරග වට 2-0කින් යෙනුලි ලියනගේ පරාජය කළ සසඳි ගුරුගේ දිනාගත්තාය. අනුක කඩහෙට්ටිගේ සහ ප්‍රිටිෂ් යසස තරග වට 2-0කින් පරාජය කර මෙම වයස් කාණ්ඩයේ බාලක යුගල ශූරතාව තමිඳු ප්‍රනාන්දු සහ සෙනුද නෙතිල ජය ගනිද්දී, සසඳි ගුරුගේ සහ මනුලි වරාවිටගේ විසින් තරග වට 2-1කින් යෙනුලි ලියනගේ සහ තිසුරි ශාක්‍යා පරාජය කර එහි බාලිකා යුගල ශූරතාව දිනාගත්හ.

අවුරුදු 11න් පහළ වයස් කාණ්ඩයේ බාලක ශූරතාව හංසක රෂ්මින්ද විසින්ද, බාලිකා ශූරතාව සනුමි මෙත්නාරා විසින්ද ජය ගත්තාය. මෙම වයස් කාණ්ඩයේ බාලක යුගල ශූරතාව හිරුෂාන් ජයවර්ධන සහ නවිතු විසින් ජය ගත් අතර, රෙෂිනි ප්‍රසංසා සහ විත්සදී කෞෂල්‍යා එහි බාලිකා යුගල ශූරතාව ජය ගත්හ.

ශ්‍රී ලංකා බැඩ්මින්ටන් ආයතනයේ ක්‍රීඩාගාරය, වෙළෙඳ සේවා බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයේ සහ ඩී.එස්. සේනානායක ක්‍රීඩාංගණයන්හිදී මෙම තරගාවලිය පැවැත්විණි.

ෆුබලු ලේකම්ට වැරදී ගමන් තහනමක්

ගුවන් තොටුපොළේ ජරමරයක්

දේශය

17 ඉරිදා දේශය බලන්න..

රු.100/-ට

දසත පුවත් ඔබේ දොරටු

ඔබේ පිටපත කලින් වෙන්කරවා ගන්න..

wijeya newspapers

විජය ප්‍රකාශනයක්

සනත්ට ක්‍රිකට් ආයතනයේ වසරක **ලොකු ධුරයක්**

ශ්‍රී ලංකා හිටපු සුපිරි ක්‍රිකට් ක්‍රීඩක හා හිටපු තේරීම් කමිටු ප්‍රධානී සනත් ජයසූරිය, වසරක පූර්ණ කාලීන ක්‍රිකට් උපදේශකයෙකු ලෙස පත් කළ බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය නිවේදනය කරයි.

ඔහුගේ තනතුර යටතේ ශ්‍රී ලංකා ක්‍රිකට් ජාතික වැඩසටහන්හි වෘත්තීය මට්ටම ප්‍රශස්ථ මට්ටමකට පත් කිරීම වෙනුවෙන් සියලුම ක්‍රීඩකයන් හා පුහුණු කාර්යමණ්ඩලය අධීක්ෂණය කිරීම හා සහතික කිරීමේ වගකීම සනත් වෙත පැවරෙන බව ක්‍රිකට් ආයතනය වැඩිදුරටත් නිවේදනය කරයි.

ඒ අනුව ඉහළ කාර්ය සාධන මධ්‍යස්ථාන සමග සෘජුවම කටයුතු කිරීම ඔහුගේ වගකීම් අතරට ඇතුළත් වනු ඇත.

සනත් මීට පෙර 2013-2015 වර්ෂ අතර වාරයේ ශ්‍රී ලංකා ක්‍රිකට් තේරීම් කමිටු ප්‍රධානී ලෙසින්ද ක්‍රියා කළේය.

ඉන් අනතුරුව 2016 වර්ෂයේ සිට 2017 වර්ෂයේ අග දක්වාද සනත් තේරීම් කමිටු ප්‍රධානී ලෙසින් ක්‍රියා කළේය.

1989 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා පුරා වසර 22ක් ශ්‍රීලංකාව නියෝජනය කළ සනත් අන්තර්ජාතික පිටියේ ක්‍රීඩකයෙකු ලෙස වැඩිම අත්දැකීම් සහිත පුද්ගලයෙකි. ලොව වැඩිම එක්දින තරග ප්‍රමාණයක් ක්‍රීඩා කළ ක්‍රීඩකයන් අතර තෙවැනි ස්ථානයේ පසුවන ඔහු, වැඩිම එක්දින ලකුණුලාභීන් අතරද ලොව පස්වැනි ස්ථානයේ පසුවෙයි.

යොවුන් ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලිය - 2023

අවසන් පූර්ව වටයේ තරග අද

අවසන් මහා තරගය අනිද්දා

ශ්‍රී ලංකාව තරගාවලි ඉතිහාසයේ දුර්වලම ප්‍රතිඵලය වාර්තා කරයි

ඕෂින වරකපිටිය

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී පැවැත්වෙන යොවුන් ආසියානු කුසලාන එක්දින ක්‍රිකට් තරගාවලියේ අවසන් පූර්ව වටයේ තරග අද (15දා) පැවැත්වේ.

එහිදී සත්කාරක එක්සත් අරාබි එමීර් රාජ්‍යය පාකිස්තානය සමගින් හා පසුගිය වර ශූරයන් වූ ඉන්දියාව, බංග්ලාදේශය සමගින් තරග වැදීමට නියමිතය.

මෙහිදී පාකිස්තානය හා බංග්ලාදේශය තරගාවලියේ අපරාජිත කණ්ඩායම් ලෙසින් අවසන් පූර්ව වටයට පිවිසීමට නියමිතය.

ඉන්දියාව හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය තරගාවලියේ සහභාගි වූ තරග තුනෙන් දෙකක් බැගින් ජයගෙන අවසන් පූර්ව වටයට සුදුසුකම් ලබා සිටියි. මෙම තරග දෙකම අද (15දා) ශ්‍රී ලංකාවේ වේලාවෙන් උදෑසන 9.30ට ආරම්භ වනු ඇත.

තරගාවලියේ වැඩිම වාර ගණනක් ශූරයන් වූ ඉන්දියාව මේ දක්වා පැවති අදියර 9න් 8කදීම ශූරතාව හිමිකරගෙන තිබීම විශේෂත්වයකි. 2012 වර්ෂයේදී පාකිස්තානය, ඉන්දියාව සමගින් මෙම තරගාවලියේ සමශූරතාව හිමිකර ගත්තේ අවසන් මහා තරගයේ ලකුණු සමවීම හේතුවෙනි. ඊට අමතරව 2017 වර්ෂයේදී ඇෆ්ගනිස්තානය මෙහි ශූරතාවද දිනාගෙන ඇත.

මේ අතර තරගාවලියේ වැඩිම වාර ගණනක් අනුශූරතාව දිනූ (5) ශ්‍රී ලංකාව තරගාවලියේ මූලික වටයෙන්ම ඉවත්වීමට සිදු වූයේ, සත්කාරක එ.අ.එමීර් රාජ්‍යයට හා බංග්ලාදේශයට පරාජයට පත් වීම හේතුවෙනි. ඔවුන් එහිදී ජයග්‍රහණය කළේ, ජපානය සමගින් වූ තරගය පමණි.

මෙම තරගාවලි ඉතිහාසයේ මීට පෙර පැවති අදියර 9වම සහභාගි වී ඇති ශ්‍රී ලංකාව සමගින් මෙවර අවසන් පූර්ව වටයට සුදුසුකම් ලබා නොමැත්තේ අවස්ථා දෙකකදී පමණි. 2017 වර්ෂයේදී මැලේසියාවේදී පැවති තරගාවලියේදී ද ඔවුන් තරගාවලියේ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලබාගැනීමට නොහැකි වුවද, එවර ඔවුන් මූලික වටයේ සහභාගි වූ තරග තුනෙන් දෙකක් ජය ගැනීමට සමත් වූහ.

ඒ අනුව මූලික වටයේ තරග තුනෙන් එකක් පමණක් ජය ගනිමින් ශ්‍රී ලංකාව මෙවර වාර්තා කළේ, සිය ඉතිහාසයේ දුර්වලම ප්‍රතිඵලයයි.

එසේම අද පැවැත්වෙන තරගවලින් ජයග්‍රහණය කරන කණ්ඩායම් ඛ්‍රබායි අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී අනිද්දා (17දා) තරගාවලියේ අවසන් මහා තරගයට තරග වැදීමට නියමිතය.

වයස අවුරුදු 19න් පහළ අන්තර්පාසල් ක්‍රිකට් තරගාවලිය

කොළඹ අසෝක විදුහල, යාපනය මැදි විදුහල සමගින් අද තරග බිමට

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයේ අධීක්ෂණය යටතේ පැවැත්වෙන වයස අවුරුදු 19න් පහළ අන්තර්පාසල් ක්‍රිකට් තරගාවලියේ දෙවැනි කොටස ටියර් බී කාණ්ඩයේ (Division 2 Tier B) අවසන් මහා තරගය බණ්ඩාරගම ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී අද (15දා) පැවැත්වෙන අතර, එහිදී යාපනය කණ්ඩායම කොළඹ අසෝක විදුහල සමගින් තරග වැදීමට නියමිතව ඇත.

කොළඹ අසෝක විදුහල් කණ්ඩායම

යාපනය මැදි විදුහල් කණ්ඩායම

යාපනය මැදි විදුහල තරගාවලියේ මූලික වටයේදී සිය කාණ්ඩයේ අනුශූරයන් ලෙස නිමා කළ අතර, ඔවුන් අවසන් පූර්ව වටයේදී හේනේගම මැදි විදුහල සමග පැවති තරගය විසඳුමකින් තොරව අවසන් විය. එහිදී ප්‍රසාද ලකුණු අනුව යාපනය මැදි විදුහල අවසන් පූර්ව වටයට සුදුසුකම් ලබාගත් අතර, එහිදී ඔවුහු අම්බලන්ගොඩ පී. ද එස්. කුලරත්න විදුහල පරාජයට පත් කරමින් අවසන් මහා තරගයට සුදුසුකම් ලැබූහ.

ඔවුන්ගේ ප්‍රතිවාදීන් වන කොළඹ අසෝක විදුහල, මූලික වටයේදී සිය කාණ්ඩයේ සිවුවැනි ස්ථානය දිනාගනිමින් අර්ධ අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබූහ. එහිදී ඔවුන් ජාඇල ක්‍රිස්තුරාජ විදුහල පරදමින් අවසන් පූර්ව වටයට සුදුසුකම් ලැබූ අතර, අවසන් පූර්ව වටයේදී මහනුවර කිංග්ස්වුඩ් විදුහල පරාජයට පත් කරමින් අවසන් මහා තරගයට සුදුසුකම් ලැබූහ.

ලයන්ස් ජල ක්‍රීඩා සමාජ 14වැනි කි.මී. 02 විවෘත මුහුදු පිහිනුම් තරගය

විවෘත ශූරතාව

පිරිමි - නිරෝද් තීක්ෂණ කාන්තා - ෂෙහාරා අනුහංසි

කරන්දෙණිය - එම්. සුසිල් ප්‍රියන්ත

අම්බලන්ගොඩ ලයන්ස් ජල ක්‍රීඩා සමාජය විසින් 14වැනි වරටත් සංවිධානය කරනු ලැබූ කිලෝමීටර් 02 විවෘත මුහුදු පිහිනුම් තරගයේ පිරිමි ශූරතාව සත්කාරක ලයන්ස් ජල ක්‍රීඩා සමාජයේ අයි. නිරෝද් තීක්ෂණ විසින් දිනා ගත් අතර, එහි විවෘත කාන්තා ශූරතාව අම්බලන්ගොඩ ඩොල්පින් ජල ක්‍රීඩා සමාජයේ ෂෙහාරා අනුහංසි විසින් දිනා ගත්තාය.

අම්බලන්ගොඩ ලයන්ස් ජල ක්‍රීඩා සමාජයේ සභාපති චතුක ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් අම්බලන්ගොඩ ඌරවත්ත වෙරළ තීරයේ ඉකුත්දා (09දා) පෙරවරුවේ පැවති මෙම තරගාවලිය සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සියයක් පමණ සහභාගි වූහ.

ඉන් පිරිමි තරගයට සහභාගි වූ ක්‍රීඩකයන් 60දෙනෙකු අතරින් අයි. නිරෝද් තීක්ෂණ විනාඩි 36:17:42කින් තරගය නිමාකර ශූරතාව දිනා ගනිද්දී, විනාඩි 32:05:16කින් නිමා කළ අම්බලන්ගොඩ ඩොල්පින් ජල ක්‍රීඩා සමාජයේ කේ. අදීෂ කෞෂංකට අනුශූරතාවත්, විනාඩි 32:09:00කින් තරගය නිමා කළ අම්බලන්ගොඩ ඩොල්පින් ජල ක්‍රීඩා සමාජයේම ඩඩ්. සනුෂ් දෙනුවන් සිල්වාට එහි තෙවැනි ස්ථානයත් හිමිවිය.

පිරිමි තරගයේ ජයග්‍රාහකයෝ - වමේ සිට - කේ. අදීෂ (වමේ), අයි. නිරෝද් තීක්ෂණ (මැද) හා ඩඩ්. සනුෂ් දෙනුවන්

කාන්තා තරගයේ ජයග්‍රාහිකාවෝ - වමේ සිට - දුනිත් තෙසාරා (වමේ), ෂෙහාරා අනුහංසි (මැද) හා තෙසාරා සෙනුලි

එමෙන්ම කාන්තා තරගයට එක්වූ ක්‍රීඩිකාවන් 40දෙනෙකු අතරින් ෂෙහාර අනුහංසි විනාඩි 36:17:42කින් තරගය නිමාකර ශූරතාව දිනාගත්තාය. විනාඩි 41:43:45කින් තරගය නිමා කළ අම්බලන්ගොඩ ඩොල්පින් ජල ක්‍රීඩා සමාජයේම දුනිත් තෙසාරා ද සිල්වා අනුශූරතාවත්, විනාඩි 43:25:13කින් තරගය නිමා කළ එම ජල ක්‍රීඩා සමාජයේම තිසාරා සෙනුලි තෙවැනි ස්ථානයත් දිනා ගත්හ.

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 08 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2023 දෙසැම්බර් මස 15වැනි සිකුරාදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.